| විස්තර | එකතුව | මුළු එකතුව | එකතුව | මුළු එකතුව |
| | | | | |
| **101 - 2601 - ගොඩනැගිලි (පුනරාවර්තන)** | 70,803,833 | **70,803,833** | 55,110,699 | **55,110,699** |
| | | | | |
| වැටුප් සහ වේතන -අධ්‍යයන | | | | |
| වැටුප් සහ වේතන | 375,085,459 | | 351,179,798 | |

| | | | | |
|---|---|---|---|---|
| වි.වි. අර්ථ සාධක අරමුදල | 97,749,797 | | 85,008,338 | |
| විශ්‍රාම වැටුප් | 36,638,654 | | 29,330,728 | |
| විශ්‍රාම වැටුප්- හිඟ | 196,393 | | - | |
| සේ.නි.භාර අරමුදල | 27,603,344 | | 22,880,200 | |
| සේ.නි.භාර අරමුදල-හිඟ | 568,660 | | - | |
| වැඩ බැලීමේ දීමනා | 322,957 | | 96,857 | |
| අධ්‍යයන දීමනා | 406,476,925 | | 342,875,478 | |
| සමකරණ දීමනා | 37,404 | | 221,892 | |
| බාහිර කථිකාචාර්ය දීමනා | 31,628,890 | | 26,097,382 | |
| ජීවන වියදම් දීමනා | 71,553,009 | | 68,227,668 | |
| දීමනා | 67,184,376 | | 68,249,425 | |
| වෙනත් දීමනා | 4,240,529 | | 4,800,168 | |
| පර්යේෂණ දීමනා | 101,194,593 | | 96,579,738 | |
| දේපල ණය පොලී | 34,603 | | - | |
| 20% දීමනාව | 62,229,237 | | 60,172,942 | |
| අන්තර් දීමනා | 92,493,275 | | 76,980,830 | |
| සංග්‍රහ දීමනා | 2,689 | | - | |
| ගැලපුම් දීමනා | 321,919 | **1,375,562,712** | - | **1,232,701,445** |
| | | | | |
| | | | | |
| | | | | |
| **වැටුප් සහ වේතන -අනධ්‍යයන** | | | | |
| වැටුප් සහ වේතන | 247,148,384 | | 239,516,409 | |
| වි.වි. අර්ථ සාධක අරමුදල | 35,813,576 | | 31,957,034 | |
| විශ්‍රාම වැටුප් | 18,414,850 | | 15,061,420 | |
| විශ්‍රාම වැටුප්- හිඟ | 122,973 | | - | |

| | | | | |
|---|---|---|---|---|
| සේ.නි.භාර අරමුදල | 10,845,016 | | 9,499,972 | |
| සේ.නි.භාර අරමුදල-හිඟ | 545,415 | | - | |
| වැඩ බැලීමේ දීමනා | 284,963 | | 93,165 | |
| අතිකාල | 35,218,014 | | 29,872,826 | |
| නිවාඩු දින දීමනා | 210,391 | | 290,787 | |
| ජීවන වියදම් දීමනා | 86,986,256 | | 83,760,519 | |
| දීමනා | 44,055,001 | | 46,597,061 | |
| වෙනත් දීමනා | 2,035,099 | | 2,113,633 | |
| සමකරණ දීමනා | 213,991 | | - | |
| 20% දීමනාව | 94,583,285 | | 89,120,516 | |
| අන්තර් දීමනා | 110,351,588 | | 95,233,218 | |
| පයෙර්ෂණ දීමනා | 3,563,074 | | 4,068,260 | |
| ගැලපුම් දීමනා | 776,005 | **691,167,879** | - | **647,184,819** |
| | | | | |
| **මුළු පෞද්ගලික වැටුප් හා දීමනා** | | **2,066,730,591** | | **1,879,886,264** |
| | | | | |
| **ගමනාගමන** | | | | |
| දේශීය | 2,694,343 | | 2,146,115 | |
| විදේශ | 6,340,988 | **9,035,331** | 6,586,078 | **8,732,193** |
| | | | | |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | |
| ලිපි ද්‍රව්‍ය සහ කායර්ාලීය අවශ්‍යතා | 34,726,670 | | 29,816,022 | |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | 9,230,806 | | 9,653,587 | |
| නිල ඇඳුම් | 1,347,109 | | 910,424 | |
| යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 1,060,567 | | 871,772 | |
| රසායනික ද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ | 33,213,872 | | 23,931,791 | |

| | | | | |
|---|---|---|---|---|
| වෛද්‍ය සැපයුම් | 779,537 | | 407,874 | |
| වෙනත් | 29,241,740 | **109,600,301** | 29,385,721 | **94,977,189** |
| | | | | |
| **වත්කම් නඩත්තු වියදම්** | | | | |
| වාහන | 12,998,624 | | 9,484,916 | |
| පිරියත යන්ත්‍ර සහ උපකරණ | 17,130,275 | | 19,977,612 | |
| ගොඩනැගිලි සහ සැකිලි | 19,848,274 | | 10,213,411 | |
| ගෘහ භාණ්ඩ | - | | 61,708 | |
| වෙනත් | 1,620,377 | **51,597,549** | 2,060,949 | **41,798,595** |
| | | | | |
| **කොන්ත්‍රාත් සේවා** | | | | |
| ප්‍රවාහන | 3,991,307 | | 2,454,308 | |
| සන්නිවේදන | 33,588,666 | | 28,648,451 | |
| තැපැල් ගාස්තු | 1,591,612 | | 1,406,351 | |
| විදුලිය | 103,550,646 | | 97,107,345 | |
| ආරක්ෂණ සේවා | 47,733,231 | | 43,539,806 | |
| ජලය | 26,473,416 | | 26,498,424 | |
| පවිත්‍රතා සේවා | 40,119,805 | | 38,137,909 | |
| වාරික සහ බදු කුලී | 10,283,798 | | 8,227,178 | |
| වරිපනම් සහ බදු පළාත්පාලන ආයතන සඳහා | 5,909,085 | | 11,074,491 | |
| මුද්‍රණය සහ ප්‍රචාරණය | 7,729,262 | | 5,136,490 | |
| වෙනත් | 2,226,222 | **283,197,050** | 2,085,685 | **264,316,438** |
| | | | | |
| **වෙනත් සේවා** | | | | |
| විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ගමන් ගාස්තු | 138,579 | | - | |
| විශේෂ සේවා පාලක සභා කමිටුව | 2,297,271 | | 2,015,128 | |
| විශේෂ සේවා- වෘත්තීය සහ | | | | |

| | | | | |
|---|---|---|---|---|
| වෙනත් | 9,968,848 | | 4,778,672 | |
| වැඩමුළු, සම්මන්ත්‍රණ හා රැස්වීම් | 1,558,556 | | 2,539,006 | |
| ශාස්ත්‍රීය පයෙර්ෂණ | 1,864,260 | | 2,826,939 | |
| දේශීය පුහුණු සේවා (කායර් මණ්ඩල සංවධර්න) | 4,897,804 | | 2,520,146 | |
| පශ්චාත් උපාධි පයෙර්ෂණ සහ ශිෂ්‍යාත්ම | 7,279,540 | | 3,050,000 | |
| ශිෂ්‍යයන් සහ ඉගෙනීමේ ගුණාත්මක සංවධර්නය සඳහා පාඨමාලා ද්‍රව්‍ය | 471,450 | | 733,032 | |
| කමර්ාන්ත සීමාවාසික පුහුණු ප්‍රායෝගික සහ වෘත්තීය උපදේශණ | - | | 340,200 | |
| ශිෂ්‍ය සංවධර්න පියවර සහ ප්‍රජා සම්බන්ධතා සාමාන්‍ය | 2,403,660 | | 2,094,470 | |
| විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතු - සාමාන්‍ය පරිපාලනය | 2,540,300 | | 1,392,380 | |
| ශිෂ්‍ය සුබ සාධන, සේවක සුබ සාධන, ශිෂ්‍ය සභා සහ සමාජ සංහිඳියා | 209,760 | | 1,800 | |
| නිවාඩු බලපත්‍ර | 4,345,086 | | 4,252,860 | |
| සංග්‍රහ වියදම | 10,769,649 | | 6,740,190 | |
| බැංකු ගාස්තු | 165,801 | | 67,840 | |
| ත්‍යාග සහ වන්දි පරිත්‍යාග | 1,025,853 | | 354,290 | |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | 2,197,659 | | 686,336 | |
| උපාධි ප්‍රදානෝත්සවය | 6,495,765 | | 3,356,458 | |
| විභාග වියදම | 31,485,051 | | 34,587,320 | |
| වෙනත් | 21,196,997 | | 15,835,213 | |
| නේවාසිකාගාර ශිෂ්‍යාධාර | 3,256,000 | | 3,951,659 | |
| දේපල ණය සඳහා පොලී සහනාධාර | 5,815,348 | | 5,191,831 | |
| කල්බදු පොලී | 3,011,526 | **123,394,762** | 954,566 | **98,270,334** |
| | | | | |
| ශිෂ්‍යාධාර | 45,885,300 | | 24,317,900 | |
| මහපොල | 149,202,550 | | 83,621,800 | |

| | | | | |
|---|---|---|---|---|
| මහපොළ භාර අරමුදල් සංරචක | 145,205,250 | **340,293,100** | 109,911,500 | **217,851,200** |
| | | | | |
| | | | | |
| **එකතුව** | | **3,054,652,518** | | **2,660,942,912** |

වියදම් ප්‍රකාශය -සටහන 14- වැඩසටහන 01 -සාමාන්‍ය පාලනය සහ කාර්ය මණ්ඩල සේවා

| අයිතම නාමය | සාමාන්‍ය පාලනය | මූල්‍ය පරිපාලනය | සැපයුම් | ආරක්ෂක සේවා | ප්‍රවාහන | එකතුව |
|---|---|---|---|---|---|---|
| | **01-01** | **01-02** | **01-03** | **01-04** | **01-05** | |
| **101 - 2601 - ගොඩනැගිලි (සුනරාවර්තන)** | 2,888,808 | - | - | - | - | 2,888,808 |
| | | | | | | |
| වැටුප් සහ වේතන -අධ්‍යයන | | | | | | |
| වැටුප් සහ වේතන | 971,666 | - | - | - | - | 971,666 |
| වි.වි.අ. අරමුදල | 392,193 | - | - | - | - | 392,193 |
| විශ්‍රාම වැටුප් | 3,087 | - | - | - | - | 3,087 |
| විශ්‍රාම වැටුප්- හිහ | 196,393 | - | - | - | - | 196,393 |
| සේ.නි.භාර අරමුදල | 81,592 | - | - | - | - | 81,592 |
| සේ.නි.භාර අරමුදල- හිහ | 568,660 | - | - | - | - | 568,660 |
| අධ්‍යයන දීමනා | 1,405,992 | - | - | - | - | 1,405,992 |
| ජීවන වියදම් දීමනා | 101,400 | - | - | - | - | 101,400 |
| දීමනා | 154,688 | | - | | - | 154,688 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | - | | - | | |
| වෙනත් දීමනා | 6,000 | - | - | - | - | 6,000 |
| පයෙර්ෂණ දීමනාව | 624,913 | - | - | - | - | 624,913 |
| 20% දීමනාව | 195,407 | - | - | - | - | 195,407 |
| අන්තර් දීමනාව | 130,253 | - | - | - | - | 130,253 |
| **වැටුප් සහ වේතන -අධ්‍යයන** | | | | | | |
| වැටුප් සහ වේතන | 21,790,413 | 10,304,712 | 2,068,342 | - | 6,154,289 | 40,317,755 |
| වි.වි.අ. අරමුදල | 3,389,613 | 1,349,835 | 284,150 | - | 819,363 | 5,842,960 |
| විශ්‍රාම වැටුප් | 1,972,327 | 787,456 | 147,253 | - | 512,092 | 3,419,128 |
| විශ්‍රාම වැටුප්- හිහ | 122,973 | - | - | - | - | 122,973 |
| සේ.නි.භාර අරමුදල | 1,008,110 | 471,227 | 86,281 | - | 285,780 | 1,851,398 |
| සේ.නි.භාර අරමුදල- හිහ | 545,415 | - | - | - | - | 545,415 |
| වැඩ බැලීමේ දීමනා | - | 179,419 | - | - | - | 179,419 |
| අතිකාල | 2,612,993 | 804,390 | 797,442 | - | 4,470,346 | 8,685,170 |
| නිවාඩු දින දීමනා | 5,554 | 5,642 | 1,360 | - | - | 12,556 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ජීවන වියදම් දීමනා | 7,884,861 | 3,273,484 | 807,677 | - | 2,375,930 | 14,341,953 |
| දීමනා | 3,971,929 | 1,847,711 | 365,081 | - | 1,108,624 | 7,293,345 |
| වෙනත් දීමනා | 90,710 | 106,462 | - | - | 1,200 | 198,373 |
| 20% දීමනාව | 8,636,260 | 4,060,230 | 773,297 | - | 2,411,289 | 15,881,076 |
| අන්තර් දීමනාව | 10,135,935 | 4,210,902 | 1,039,085 | - | 3,054,823 | 18,440,745 |
| පයෙර්ෂණ දීමනාව | 771,416 | 506,368 | 38,819 | - | - | 1,316,602 |
| **එකතුව- පෞද්ගලික වැටුප් හා දීමනා** | ***67,770,755*** | ***27,907,838*** | ***6,408,785*** | **-** | ***21,193,735*** | ***123,281,114*** |
| | | | | | | |
| **ගමනාගමන** | | | | | | |
| දේශීය | 1,180 | - | - | - | 464,498 | 465,678 |
| විදේශීය | 225,000 | 128,500 | - | - | - | 353,500 |
| | | | | | | |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | | | |
| ලිපි ද්‍රව්‍ය සහ කායර්ාලීය අවශ්‍යතා | 5,218,807 | 705,284 | 223,436 | - | - | 6,147,527 |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | 266,020 | - | - | - | 7,757,150 | 8,023,170 |
| නිල ඇඳුම් | 34,135 | 12,465 | 3,600 | - | 100,485 | 150,685 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වෙනත් | 1,448,584 | 3,893,638 | 32,913 | - | - | 5,375,135 |
| **වත්කම් නඩත්තු වියදම්** | | | | | | |
| වාහන | - | 14,648 | - | - | 12,487,289 | 12,501,936 |
| පිරියත යන්ත්‍ර සහ උපකරණ | 1,195,635 | 1,027,372 | 66,661 | - | 14,550 | 2,304,218 |
| ගොඩනැගිලි සහ සැකිලි | 698,055 | 1,733 | 2,222,788 | - | - | 2,922,576 |
| වෙනත් | 15,000 | - | - | - | - | 15,000 |
| | | | | | | |
| **කොන්ත්‍රාත් සේවා** | | | | | | |
| ප්‍රවාහන | 1,639,108 | 35,623 | 27,190 | - | - | 1,701,921 |
| සන්නිවේදන | 18,723,171 | 497,575 | 139,688 | - | 1,662 | 19,362,095 |
| තැපැල් ගාස්තු | 196,061 | 92,700 | 177,850 | - | - | 466,611 |
| විදුලිය | 42,095 | - | - | 43,615,013 | - | 43,657,108 |
| පවිත්‍රතා සේවා | 3,218,734 | - | - | - | - | 3,218,734 |
| වාරික සහ බදු කුලී | 14,692 | - | - | - | - | 14,692 |
| වරිපනම් සහ බදු පළාත්පාලන ආයතන සඳහා | 5,628,835 | 54,881 | - | - | - | 5,683,715 |
| මුද්‍රණය සහ ප්‍රචාරණය | 6,488,128 | | - | | - | 6,488,128 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | - | | - | | |
| වෙනත් | 112,042 | 111,446 | - | - | - | 223,488 |
| **වෙනත් සේවා** | | | | | | |
| විශේෂ සේවා පාලක සභා කමිටුව | 1,159,850 | - | - | - | - | 1,159,850 |
| විශේෂ සේවා- වෘත්තීය සහ වෙනත් | 8,057,048 | - | 201,300 | - | - | 8,258,348 |
| වැඩමුළු, සම්මන්ත්‍රණ හා රැස්වීම් | 705,817 | 119,133 | - | - | - | 824,950 |
| ශාස්ත්‍රීය පයෙර්ෂණ | 107,703 | - | - | - | - | 107,703 |
| දේශීය පුහුණු සේවා (කායර් මණ්ඩල සංවධර්න) | 1,754,750 | - | - | - | - | 1,754,750 |
| නිවාඩු ගමන් බලපත්‍ර | 1,671,685 | 85,350 | 46,540 | - | 3,150 | 1,806,725 |
| සංග්‍රහ වියදම් | 1,529,154 | 78,531 | 86,446 | - | - | 1,694,130 |
| බැංකු ගාස්තු | 8,178 | 20,793 | - | - | - | 28,971 |
| ත්‍යාග සහ වන්දි පරිත්‍යාග | 649,903 | - | - | - | - | 649,903 |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | 1,767,703 | 15,750 | - | - | - | 1,783,453 |
| විභාග වියදම | 15,100 | - | - | - | - | 15,100 |
| වෙනත් | 870,808 | 267,100 | 23,750 | - | 12,200 | 1,173,858 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දේපල ණය සඳහා පොලී සහනාධාර | 132,898 | 103,716 | 39,195 | - | 27,151 | 302,959 |
| කල්බදු පොලී | 3,011,526 | - | - | - | - | 3,011,526 |
| එකතුව | **137,266,968** | **35,174,074** | **9,700,141** | **43,615,013** | **42,061,869** | **267,818,065** |

**- වියදම් ප්‍රකාශය -සටහන 14- වැඩසටහන 02- අධ්‍යයන සේවා**

| අයිතම නාමය | කලා | අධ්‍යාපන | වෛද්‍ය | කළ.හා මූල්‍ය | විභාග | උ. අ.පීඨය | ශ්‍රීපාලි මණ්ඩපය | කා.සං.ම. | ජා. මට්ටම | නිපුණතා නැංවීම | ශි.අ.කාර්යාලය | පර්යේෂණ දිරිගැන්වීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **02-04** | **02-06** | **02-11** | **02-12** | **02-17** | **02-18** | **02-19** | **02-20** | **02-21** | **02-23** | **02-24** | **02-27** |
| **101 - 2601 - ගොඩනැගිලි (පුනරාවර්තන)** | 11,106,376 | 873,825 | 7,499,092 | 5,115,953 | - | 3,212,243 | 8,033,692 | - | - | - | - | - |
| | | | | | | | | | | | | |
| **වැටුප් සහ වේතන - අධ්‍යයන** | | | | | | | | | | | | |
| වැටුප් සහ වේතන | 90,084,588 | 14,353,754 | 92,873,202 | 35,221,421 | - | 1,192,357 | 12,540,799 | 671,981 | - | - | 45,000 | - |
| වි.වි.අ.අ. | 24,091,590 | 3,870,809 | 23,770,965 | 8,918,058 | - | 429,716 | 2,239,567 | 272,430 | - | - | 3,613 | - |
| විශ්‍රාම වැටුප් | 8,314,631 | 1,653,285 | 9,927,827 | 4,668,737 | - | - | 2,343,787 | - | - | - | 4,129 | - |
| සේ.නි.හා.අ. | 6,483,270 | 1,104,819 | 7,459,823 | 2,717,360 | - | 85,943 | 916,671 | 54,486 | - | - | 1,548 | - |
| වැඩබැලීම් දීමනාව | - | - | 322,957 | - | - | - | - | - | - | - | - | - |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අධ්‍යයන දීමනාව | 97,280,902 | 17,574,253 | 108,760,044 | 43,742,866 | - | 1,369,268 | 12,834,488 | 898,331 | - | - | - | - |
| සමකරණ දීමනාව | - | - | 37,404 | - | - | - | - | - | - | - | - | - |
| බා. කථිකාචාර්‍ය දීමනාව | 14,435,356 | 1,348,065 | 1,082,155 | 1,467,894 | - | - | 5,877,375 | - | - | - | - | - |
| ජීවන වියදම් දීමනාව | 17,092,411 | 2,607,449 | 16,767,858 | 6,213,744 | - | 171,566 | 2,586,885 | 93,600 | - | - | - | - |
| දීමනා | 16,109,631 | 2,527,803 | 17,104,915 | 6,263,440 | - | 203,079 | 2,129,754 | 118,343 | - | - | - | - |
| වෙනත් දීමනා | 811,711 | 125,023 | 1,768,402 | 273,181 | - | 19,984 | 71,445 | 40,966 | - | - | - | - |
| පයෙර්ෂණ දීමනා | 25,664,966 | 4,277,574 | 27,411,592 | 11,171,938 | - | 360,534 | 3,520,821 | 231,216 | - | - | - | - |
| දේපල ණය පොලී | - | - | 34,603 | - | - | - | - | - | - | - | - | - |
| 20% දීමනාව | 14,711,549 | 2,814,406 | 16,270,564 | 6,663,289 | - | 182,281 | 2,371,089 | 132,123 | - | - | - | - |
| අන්තර් දීමනාව | 21,990,720 | 3,366,151 | 21,575,546 | 8,006,891 | - | 220,608 | 3,740,485 | 120,593 | - | - | - | - |
| සංග්‍රහ දීමනාව | - | - | - | - | - | - | 2,689 | - | - | - | - | - |
| ගැලපුම් දීමනාව | - | - | - | - | - | - | 321,919 | - | - | - | - | - |
| **වැටුප් සහ වේතන - අනධ්‍යයන** | | | | | | | | | | | | |
| වැටුප් සහ වේතන | 17,126,359 | 5,036,104 | 62,484,008 | 7,497,443 | 5,437,531 | 2,749,653 | 18,763,984 | 609,057 | 4,692,602 | - | 1,394,182 | 100,000 |
| වි.වි.අ.අ. | 2,591,378 | 734,428 | 9,066,595 | 854,576 | 792,662 | 408,521 | 2,770,476 | 69,533 | - | - | 145,316 | - |
| විශ්‍රාම වැටුප් | 1,281,654 | 381,397 | 4,072,539 | 855,054 | 458,977 | 201,197 | 1,441,581 | 79,466 | - | - | 99,499 | - |
| සේ.නි.භා.අ. | 774,606 | 223,165 | 2,629,554 | 341,926 | 250,328 | 121,944 | 840,303 | 29,800 | - | - | 48,963 | - |
| වැඩබැලීම් දීමනාව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| අතිකාල | 1,648,826 | 12,649 | 7,204,401 | 579,119 | 415,066 | - | 3,589,680 | - | - | - | - | - |
| නිවාඩු දින දීමනා | - | - | 56,580 | - | 13,950 | - | 21,121 | - | - | - | - | - |
| ජීවන වියදම් දීමනාව | 5,950,603 | 1,630,452 | 22,038,186 | 2,659,800 | 2,012,400 | 897,000 | 6,854,271 | 280,800 | - | - | 374,400 | - |
| දීමනා | 3,054,362 | 913,631 | 11,544,165 | 1,358,568 | 980,197 | 500,151 | 3,413,140 | 109,597 | - | - | 203,399 | - |
| වෙනත් දීමනා | 65,631 | 20,600 | 821,729 | 4,200 | 4,200 | - | 45,336 | 316,750 | - | - | 10,825 | - |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 20% දීමනාව | 6,631,768 | 1,950,478 | 23,636,972 | 2,966,666 | 2,141,900 | 1,083,779 | 7,813,558 | 239,852 | - | - | 459,919 | - |
| අන්තර් දීමනාව | 7,656,801 | 2,097,296 | 28,330,948 | 3,420,408 | 2,587,773 | 1,153,512 | 7,308,817 | 360,901 | - | - | 481,589 | - |
| පයෙර්ෂණ දීමනා | 343,940 | 131,653 | 294,801 | 376,404 | 150,744 | 162,313 | 253,448 | - | - | - | - | - |
| ගැලපුම් දීමනාව | - | - | - | - | - | - | 776,005 | - | - | - | - | - |
| **එකතුව-පෞද්ගලික වැටුප් හා දීමනා** | ***384,197,253*** | ***68,755,241*** | ***517,348,333*** | ***156,242,983*** | ***15,245,728*** | ***11,513,408*** | ***105,389,495*** | ***4,729,824*** | ***4,692,602*** | ***-*** | ***3,272,382*** | ***100,000*** |
| | | | | | | | | | | | | |
| **ප්‍රවාහනය** | | | | | | | | | | | | |
| දේශීය | 11,450 | - | 569,468 | 25,537 | - | - | 104,910 | - | 931,798 | - | - | 180,612 |
| විදේශීය | 377,548 | 335,478 | 549,986 | 184,036 | - | - | 250 | - | 2,782,203 | - | - | 265,789 |
| | | | | | | | | | | | | |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | | | | | | | | | |
| ලිපිද්‍රව්‍ය හා කායර්ාල අවශ්‍යතා | 4,124,584 | 460,882 | 8,251,027 | 2,050,915 | 4,625,014 | - | 1,062,042 | 123,282 | 242,445 | - | 154,052 | 16,311 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 11,150 | - | 260,621 | - | - | - | 788,036 | - | - | - | - | - |
| නිල ඇඳුම් | 125,335 | 11,275 | 470,251 | 10,800 | 5,400 | 13,800 | 252,073 | 1,800 | - | - | 1,800 | - |
| යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ | - | - | 319,132 | 123,014 | - | - | 618,420 | - | - | - | - | - |
| රසායන හා පරිභෝජන ද්‍රව්‍ය | - | - | 6,344,057 | - | - | - | - | - | 6,904,123 | - | - | 277,996 |
| වෛද්‍ය සැපයුම් | - | - | 447,279 | - | - | - | 46,804 | - | - | - | - | - |
| වෙනත් | 969,338 | 457,521 | 421,369 | 1,040,910 | 113,186 | - | 2,034,011 | 5,211 | 953,140 | - | 24,369 | 30,772 |
| | | | | | | | | | | | | |
| **වත්කම් නඩත්තු** | | | | | | | | | | | | |
| වාහන | - | - | - | - | - | - | 479,187 | - | - | - | - | - |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පිරියත, දේපල හා උපකරණ | 1,351,924 | 309,223 | 3,116,394 | 1,298,565 | 228,775 | - | 546,992 | 162,234 | - | - | 60,467 | - |
| ගොඩනැගිලි හා සැකිලි | 23,715 | 32,626 | 1,550 | 70,503 | 2,261 | - | 53,676 | - | - | - | - | - |
| වෙනත් | - | - | 1,388,241 | 4,270 | - | - | 58,410 | - | - | - | - | - |
| | | | | | | | | | | | | |
| **කොන්ත්‍රාත් සේවා** | | | | | | | | | | | | |
| ප්‍රවාහන | 86,717 | 82,950 | 851,840 | 3,900 | 722 | - | 460,723 | 2,530 | 431,935 | - | 31,270 | - |
| සංනිවේදන | 575,802 | 240,553 | 6,199,057 | 490,800 | 134,743 | 142,928 | 4,561,212 | 25,625 | 461 | - | 67,979 | - |
| තැපැල් ගාස්තු | 110,329 | 6,420 | 373,850 | 44,640 | 295,839 | - | 114,855 | 730 | - | - | - | - |
| විදුලිය | - | 2,877 | 19,292,823 | - | - | - | 4,317,573 | - | - | - | - | - |
| ආරක්ෂක සේවා | - | - | 7,000 | - | - | - | 4,069,122 | - | - | - | - | - |
| ජලය | - | - | 1,833,923 | - | - | - | 1,244,438 | - | - | - | - | - |
| පවිත්‍රතා සේවා | 3,512,731 | 1,255,200 | 4,155,627 | 2,778,910 | - | - | 2,530,100 | - | - | - | - | - |
| වාරික සහ බදු කුලී | - | 7,000 | 3,454,334 | - | - | - | 68,015 | - | - | - | - | - |
| වරිපනම් සහ බදු පළාත්පාලන ආයතන සඳහා | - | - | 191,512 | - | - | - | 33,858 | - | - | - | - | - |
| මුද්‍රණ සහ දැන්වීම් | 70,380 | - | 449,613 | 25,329 | 19,360 | - | 230,797 | - | - | - | - | - |
| වෙනත් | 11,230 | - | 368,821 | 64,360 | - | - | 1,462,532 | - | 14,500 | - | - | - |
| | | | | | | | | | | | | |
| වෙනත් සේවා | | | | | | | | | | | | |
| වි.වි. ආචාර්යවරුන්ගේ ප්‍රවාහන දීමනා | - | - | 138,579 | - | - | - | - | - | - | - | - | - |
| විශේෂ සේවා පාලක සභා කමිටුව | 155,600 | - | 6,541 | 608,571 | - | - | 350,809 | 12,300 | - | - | - | - |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශේෂ සේවා වෘත්තීය සහ වෙනත් | - | 53,000 | - | - | 960,000 | - | - | 122,500 | - | 120,000 | - | - |
| වැඩමුල් සමුලු සහ රැස්වීම් | - | 314,930 | - | - | - | - | 78,342 | 134,861 | 65,475 | 100,200 | - | - |
| ශාස්ත්‍රීය පයෙර්ෂණ | 21,693 | - | - | - | - | - | - | - | 162,471 | - | 8,069 | 1,564,325 |
| දේශීය පුහුණු සේවා (කායර් මණ්ඩලසංවධර්න) | 669,315 | - | 1,542,778 | 476,220 | 6,523 | - | - | 6,000 | 25,878 | - | - | 135,500 |
| ප.උ. පයෙර්ෂණ හා ශිෂ්‍යත්ව | - | - | - | - | - | - | - | - | 75,540 | - | - | - |
| ඉගනුම් තත්ව ප්‍රවධර්නය සඳහා පාඨමාලා ද්‍රව්‍ය | - | - | - | - | - | - | 471,450 | - | - | - | - | - |
| ශිෂ්‍ය සංවධර්න හා ප්‍රජා සම්බන්ධතා | 100,000 | - | 34,545 | - | - | - | - | - | - | - | - | - |
| වි.වි. ක්‍රීඩා කටයුතු - සා.පා. | - | - | 143,750 | - | - | - | - | - | - | - | - | - |
| ශිෂ්‍ය සුබ සාධන, සේවක සුබ සාධන, ශිෂ්‍ය සභා සහ සමාජ සංහිඳියා | - | - | - | - | - | - | - | - | - | - | 209,760 | - |
| නිවාඩු ගමන් බලපත්‍ර | 284,365 | 69,490 | 813,710 | 61,650 | 64,260 | - | 162,500 | - | - | - | - | - |
| සංග්‍රහ වියදම් | 1,758,791 | 266,054 | 1,545,923 | 29,053 | 101,411 | - | 393,310 | 41,883 | 3,100,651 | 701,700 | 77,923 | 144,442 |
| බැංකු ගාස්තු | - | - | 136,830 | - | - | - | - | - | - | - | - | - |
| ත්‍යාග සහ වන්දි පරිත්‍යාග | 48,950 | 5,000 | - | 56,000 | - | - | 5,000 | - | - | - | - | - |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දායකත්ව හා සාමාජික ගාස්තු | 47,829 | - | - | 33,750 | - | - | 112,000 | - | 33,500 | - | - | - |
| උපාධි ප්‍රදානෝත්සවය | - | - | - | 4,582 | 6,491,183 | - | - | - | - | - | - | - |
| විභාග ගාස්තු | 5,474,800 | 1,346,064 | 5,371,212 | 4,223,069 | 1,751,346 | 34,700 | 2,105,382 | - | - | - | - | - |
| වෙනත් | 675,118 | 77,532 | 2,881,378 | 1,381,693 | 113,770 | - | 650,985 | 560 | 7,166,269 | - | 102,545 | 1,330,885 |
| නේවාසික ශිෂ්‍යාධාර | 2,852,000 | - | - | 112,000 | - | - | - | - | - | - | - | - |
| දේපල ණය සඳහා පොලී සහනාධාර | 1,873,781 | 283,156 | - | 1,013,641 | 101,614 | 111,339 | 397,957 | - | - | - | - | - |
| | | | | | | | | | | | | |
| | 15,161,700 | 119,900 | 1,075,400 | 9,010,000 | - | - | 9,277,500 | - | - | - | - | - |
| මහපොල | 51,167,900 | - | 24,007,900 | 28,724,850 | - | - | 6,087,550 | - | - | - | - | - |
| මහපොල භාරකාර අරමුදල | 47,803,400 | - | 26,775,150 | 26,036,650 | - | - | 5,728,950 | - | - | - | - | - |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| එකතුව | **534,761,102** | **75,366,196** | **648,638,895** | **241,347,153** | **30,261,135** | **15,028,417** | **164,382,956** | **5,369,340** | **27,582,991** | **921,900** | **4,010,615** | **4,046,632** |

**වියදම් ප්‍රකාශය -සටහන 14-වැඩසටහන03-ඉගනුම් සම්පත්08- අනුයාත ක්‍රියාකාරකම්**

| මාතෘකාව | ඉගනුම් සම්පත් | නේවාසිකාගාර | එකතුව |
|---|---|---|---|
| | **03-01** | **08-01** | |
| **101 - 2601 - ගොඩනැගිලි (සුනරාවර්තන)** | 523,046 | 18,123,291 | 18,646,338 |
| | | | |
| වැටුප් සහ වේතන- අධ්‍යයන | | | |
| වැටුප් සහ වේතන | 5,171,856 | - | 5,171,856 |
| වි.වි.හා. අරමුදල | 1,045,522 | - | 1,045,522 |
| විශ්‍රාම වැටුප් | 740,693 | - | 740,693 |
| සේ. නි. හා. අරමුදල | 357,243 | - | 357,243 |
| බාහිර කථිකාචාර්ය දීමනා | 5,631,831 | - | 5,631,831 |
| ජීවන වියදම් දීමනා | 912,886 | - | 912,886 |
| දීමන | 819,696 | - | 819,696 |
| වෙනත් දීමනා | 566,542 | - | 566,542 |
| පයෙර්ෂණ දීමනා | 1,627,174 | - | 1,627,174 |
| 20% දීමනා | 903,524 | - | 903,524 |
| අන්තර් දීමනා | 1,175,997 | - | 1,175,997 |
| වැටුප් සහ වේතන- අනධ්‍යයන | | | |
| වැටුප් සහ වේතන | 14,044,442 | 4,485,956 | 18,530,398 |
| වි.වි.හා. අරමුදල | 2,005,265 | 576,193 | 2,581,459 |
| විශ්‍රාම වැටුප් | 1,311,015 | 421,523 | 1,732,538 |
| සේ. නි. හා. අරමුදල | 663,988 | 199,543 | 863,532 |
| අතිකාල | 2,487,540 | 196,805 | 2,684,345 |
| ජීවන වියදම් දීමනා | 5,781,383 | 1,216,800 | 6,998,183 |

| | | | |
|---|---|---|---|
| දීමනා | 2,542,409 | 812,041 | 3,354,450 |
| වෙනත් සීමනා | 13,700 | 458,242 | 471,942 |
| 20% දීමනා | 5,483,859 | 1,835,824 | 7,319,684 |
| අන්තර් දීමනා | 7,433,082 | 1,566,103 | 8,999,185 |
| පයෙර්ෂණ දීමනා | 128,266 | - | 128,266 |
| **එකතුව- පෞද්ගලික වැටුප් හා දීමනා** | ***60,847,913*** | ***11,769,032*** | ***72,616,944*** |
| | | | |
| **ප්‍රවාහන** | | | |
| ලිපිද්‍රව්‍ය හා කායර්ාල අවශ්‍යතා | 912,681 | 105,128 | 1,017,809 |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍යය | 41,860 | 5,630 | 47,490 |
| නිලඇඳුම් | 39,600 | - | 39,600 |
| වෙනත් | 393,457 | 2,266,812 | 2,660,269 |
| | | | |
| **වත්තම් නඩත්තු** | | | |
| පිරියත,යන්ත්‍ර සහ උපකරණ | 1,075,575 | 296,592 | 1,372,167 |
| ගොඩනැගිලි හා සැකිලි | 27,052 | 1,250 | 28,302 |
| වෙනත් | 93,012 | 61,444 | 154,456 |
| | | | |
| **කොන්ත්‍රාත් සේවා** | | | |
| ප්‍රවාහන | 9,637 | 112,706 | 122,343 |
| සංනිවේදන | 248,797 | 583,748 | 832,545 |
| තැපැල් ගාස්තු | 20,945 | - | 20,945 |
| පවිත්‍රතා සේවා | 1,454,801 | 15,336,447 | 16,791,248 |
| වාරික සහ බදු කුලී | - | 325,000 | 325,000 |
| මුද්‍රණ හා ප්‍රකාශන | 264,180 | - | 264,180 |
| වෙනත් | - | 20,340 | 20,340 |
| | | | |

| | | | |
|---|---|---|---|
| වෙනත් සේවා | | | |
| විශේෂ සේවා- වෘත්තීය සහ වෙනත් | 5,000 | - | 5,000 |
| වැඩමුළු, සම්මන්ත්‍රණ සහ රැස්වීම් | 13,100 | - | 13,100 |
| නිවාඩු ගමන් බලපත්‍ර | 235,120 | - | 235,120 |
| සංග්‍රහ වියදම් | 120,445 | 26,464 | 146,909 |
| දායකත්ව සහ සාමාජික අරමුදල් | 42,126 | - | 42,126 |
| වෙනත් | 28,737 | 983,142 | 1,011,879 |
| දේපල ණය සඳහා පොලී සහනාධාර | 379,200 | 46,918 | 426,119 |
| | | | |
| **එකතුව** | **66,776,284** | **50,063,944** | **116,840,227** |

වියදම් ප්‍රකාශය -සටහන 14- වැඩසටහන04- සුබසාධන සේවා

| අයිතම නාම | සෞඛ්‍යය සේවාව | ශාරීරික අධ්‍යාපන | සුබසාධන | එකතුව |
|---|---|---|---|---|
| | 04-01 | 04-02 | 04-03 | |
| **101 - 2601 - ගොඩනැගිලි (සුනරාවර්තන)** | 105,510 | 521,076 | 352,644 | 979,230 |
| | | | | |
| වැටුප් සහ වේතන- අධ්‍යයන | | | | |
| වැටුප් සහ වේතන | - | 271,221 | - | 271,221 |
| වි.වි.හා. අරමුදල | - | 25,537 | - | 25,537 |
| විශ්‍රාම වැටුප් | - | 29,186 | - | 29,186 |
| සේ. නි. හා. අරමුදල | - | 10,945 | - | 10,945 |
| බාහිර කථිකාචාර්ය දීමනා | - | 2,381,625 | - | 2,381,625 |
| ජීවන වියදම් දීමනා | - | 93,600 | - | 93,600 |
| දීමනා | - | 48,961 | - | 48,961 |
| 20% දීමනා | - | 106,854 | - | 106,854 |
| අන්තර් දීමනා | - | 120,379 | - | 120,379 |
| වැටුප් සහ වේතන- අනධ්‍යයන | | | | |
| වැටුප් සහ වේතන | 5,026,587 | 4,298,512 | 6,081,761 | 15,406,860 |
| වි.වි.හා. අරමුදල | 946,212 | 704,299 | 964,158 | 2,614,669 |
| විශ්‍රාම වැටුප් | 187,858 | 288,384 | 397,531 | 873,773 |
| සේ. නි. හා. අරමුදල | 226,814 | 198,536 | 272,338 | 697,688 |
| වැඩබැලීම් දීමනා | - | 40,494 | - | 40,494 |
| අතිකාල | 363,739 | 1,289,155 | 2,585,134 | 4,238,027 |
| නිවාඩු දින දීමනා | - | 44,073 | 29,788 | 73,861 |

| | | | | |
|---|---|---|---|---|
| ජීවන වියදම් දීමනා | 1,716,000 | 1,511,187 | 1,953,523 | 5,180,710 |
| දීමනා | 908,648 | 773,111 | 1,083,847 | 2,765,606 |
| වෙනත් දීමනා | 4,800 | 1,200 | 22,523 | 28,523 |
| සමකරණ වෙනත් දීමනා | 213,991 | - | - | 213,991 |
| 20% වෙනත් දීමනා | 1,979,850 | 1,658,197 | 2,390,828 | 6,028,875 |
| අන්තර් දීමනා | 2,206,627 | 1,943,774 | 2,528,937 | 6,679,338 |
| පයෙර්ෂණ දීමනා | - | - | 192,301 | 192,301 |
| **එකතුව- පෞද්ගලික වැටුප් හා දීමනා** | ***13,781,127*** | ***15,839,228*** | ***18,502,668*** | ***48,123,023*** |
| | | | | |
| **ප්‍රවාහන** | | | | |
| දේශීය | - | 146,778 | - | 146,778 |
| | | | | |
| **සැපයුම් සහ අවශ්‍යතා** | | | | |
| ලිපිද්‍රව්‍ය හා කායර්ාල අවශ්‍යතා | 111,463 | 181,282 | 1,080,130 | 1,372,875 |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | 6,539 | 42,749 | - | 49,288 |
| නිලඇඳුම් | 36,925 | 14,475 | 40,500 | 91,900 |
| රසායනික හා පරිභෝජන ද්‍රව්‍ය | 71,717 | - | - | 71,717 |
| වෛද්‍ය සැපයුම් | 280,240 | 5,215 | - | 285,455 |
| වෙනත් | 390,837 | 6,729,650 | 3,118,291 | 10,238,778 |
| | | | | |
| **වත්තම් නඩත්තු** | | | | |
| පිරියත, යන්ත්‍ර සහ උපකරණ | 19,364 | 40,694 | 308,051 | 368,110 |
| ගොඩනැගිලි හා සැකිලි | - | 11,792 | 9,606 | 21,398 |
| **කොන්ත්‍රාත් සේවා** | | | | |
| ප්‍රවාහන | 32 | 61,464 | 2,806 | 64,302 |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| සංනිවේදන | 66,232 | 48,000 | 105,660 | 219,892 |
| තැපැල් ගාස්තු | 40 | 3,208 | 49,438 | 52,686 |
| පවිත්‍රතා සේවා | - | 1,522,638 | - | 1,522,638 |
| වාරික සහ බදු කුලී | - | 142,974 | 6,256,783 | 6,399,757 |
| මුද්‍රණ හා ප්‍රකාශන | - | - | 32,000 | 32,000 |
| | | | | |
| **වෙනත් සේවා** | | | | |
| විශේෂ සේවා- වෘත්තීය සහ වෙනත් | - | 5,040 | - | 5,040 |
| ප. උපාධි පයෙර්ෂණ හා ශිෂ්‍යත්ව | - | - | 7,204,000 | 7,204,000 |
| වි.වි. ක්‍රීඩා ක්‍රියාකාරකම්- සා/පා. | - | 2,396,550 | - | 2,396,550 |
| නිවාඩු ගමන් බලපත්‍ර | - | 140,050 | 48,900 | 188,950 |
| සංග්‍රහ වියදම් | 880 | 53,866 | 3,290 | 58,036 |
| දායකත්ව සහ සාමාජික අරමුදල් | - | 140,000 | - | 140,000 |
| වෙනත් | 8,715 | 62,775 | 3,793,297 | 3,864,787 |
| දේපල ණය සඳහා පොලී සහනාධාර | 52,180 | - | - | 52,180 |
| | | | | |
| **එකතුව** | **14,931,800** | **28,109,502** | **40,908,065** | **83,949,367** |

**වියදම් ප්‍රකාශය -සටහන 14- වැඩසටහන05- ගොඩනැගිලි හා පහසුකම් නඩත්තු කිරීම**

| අයිතම නාම | ගොඩනැගිලි හා භූමිය | විදුලිය | ජල සැපයුම | එකතුව |
|---|---|---|---|---|
| | **05-01** | **05-02** | **05-03** | |
| වැටුප් සහ වේතන-අනධියයන | | | | - |
| වැටුප් සහ වේතන | 13,359,277 | 751,805 | 192,525 | 14,303,607 |
| වි.වි.අ.අ. | 1,963,146 | 131,961 | 20,029 | 2,115,136 |
| විශ්‍රාම වැටුප | 1,255,240 | 22,929 | 22,890 | 1,301,060 |
| සේ.නි.භා.අ. | 643,677 | 30,978 | 8,584 | 683,239 |
| වැඩබැලීම් දීමනා | 33,826 | - | - | 33,826 |
| අතිකාල | 3,075,598 | - | - | 3,075,598 |
| ජීවන වියදම් දීමනාව | 5,953,212 | 280,800 | 93,600 | 6,327,612 |
| දීමනා | 2,478,296 | 135,684 | 34,738 | 2,648,718 |
| වෙනත් දීමනා | 10,008 | 1,332 | - | 11,340 |
| 20% දීමනාව | 5,401,991 | 296,021 | 75,792 | 5,773,804 |
| අන්තර් දීමනාව | 7,650,312 | 361,053 | 120,281 | 8,131,646 |
| **එකතුව- පෞද්ගලික වැටුප් හා දීමනා** | ***41,824,583*** | ***2,012,565*** | ***568,439*** | ***44,405,586*** |
| | | | | |
| **සැපයුම් හා අවශ්‍යතා** | | | | |
| ලිපිද්‍රව්‍ය හා කායර්ාලීය අවශ්‍යතා | 376,604 | - | - | 376,604 |
| ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය | 41,101 | - | - | 41,101 |
| නිල ඇඳුම් | 40,435 | - | - | 40,435 |
| වෙනත් | 926,626 | - | - | 926,626 |
| | | | | |
| **වත්කම් නඩත්තු** | | | | |

| | | | | |
|---|---|---|---|---|
| වාහන | 17,500 | - | - | 17,500 |
| පිරියත, යන්ත්‍ර හා උපකරණ | 1,861,759 | - | - | 1,861,759 |
| ගොඩනැගිලි හා සැකිලි | 15,253,088 | - | - | 15,253,088 |
| | | | | |
| **කොන්ත්‍රාත් සේවා** | | | | |
| ප්‍රවාහන | 33,406 | 240 | - | 33,646 |
| සංනිවේදන | 104,839 | - | 2,000 | 106,839 |
| තැපැල් ගාස්තු | 240 | - | - | 240 |
| විදුලිය | - | 79,937,374 | - | 79,937,374 |
| ජලය | - | - | 23,395,055 | 23,395,055 |
| | | | | |
| **වෙනත් සේවා** | | | | |
| වැඩමුලු සමුලු සහ රැස්වීම් | 22,500 | - | - | 22,500 |
| දේශීය පුහුණු සේවා (කායර් මණ්ඩල සංවධර්න) | 8,000 | - | - | 8,000 |
| නිවාඩු ගමන් බලපත්‍ර | 265,297 | - | - | 265,297 |
| සංග්‍රහ වියදම් | 23,431 | - | - | 23,431 |
| වෙනත් | 13,855 | - | - | 13,855 |
| දේපල ණය සඳහා පොලී සහනාධාර | 80,577 | - | - | 80,577 |
| | | | | |
| **එකතුව** | **60,893,841** | **81,950,178** | **23,965,494** | **166,809,512** |

## එක් ශිෂ්‍යයෙකුට අදාළ  පුනරාවර්තන වියදම් සහ පීඨවලට අනුව ශිෂ්‍ය සංඛ්‍යාව- 2016

| පීඨය | ශිෂ්‍යය අංකය | | පුනරාවතර්න වියදම | | පරිපාලන (වැඩි) | | ප්‍රාග්ධන වියදම් | | මුළු පුනරාවතර්න වියදම | | සම්පූණර් පිරිවැය | | එක් ශිෂ්‍යයකු සඳහා පිරිවැය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| කලා | 2,355 | 2,303 | 447,616,517 | 534,761,102 | 155,757,237 | 143,622,833 | 106,028,867 | 116,785,507 | 481,896,138 | 678,383,935 | 596,916,539 | 795,169,442 | 228,919 | 345,275 |
| අධ්‍යාපන | 334 | 336 | 71,742,457 | 75,366,196 | 22,724,460 | 20,954,091 | 15,037,640 | 17,038,615 | 80,507,570 | 96,320,287 | 97,646,874 | 113,358,902 | 268,982 | 337,378 |
| විද්‍යා | 1,644 | 1,676 | 447,333,813 | 512,365,931 | 113,351,771 | 104,521,002 | 74,017,604 | 84,990,234 | 447,059,665 | 616,886,933 | 528,003,692 | 701,877,167 | 275,446 | 418,781 |
| වෛද්‍ය | 1,371 | 1,359 | 600,879,162 | 648,638,895 | 91,912,325 | 84,751,815 | 61,726,359 | 68,915,112 | 547,361,573 | 733,390,709 | 606,868,831 | 802,305,822 | 479,230 | 590,365 |
| නීති | 1,057 | 1,063 | 115,378,331 | 154,558,280 | 71,893,158 | 66,292,258 | 47,589,177 | 53,904,904 | 150,738,619 | 220,850,538 | 203,926,075 | 274,755,442 | 164,842 | 258,472 |
| මූලය | 1,780 | 1,781 | 213,720,414 | 241,347,153 | 120,453,165 | 111,069,155 | 80,140,714 | 90,314,801 | 262,488,729 | 352,416,309 | 352,684,947 | 442,731,110 | 160,767 | 248,586 |
| ශ්‍රී පාලි | 622 | 637 | 133,085,329 | 164,382,956 | 43,081,789 | 39,725,464 | 28,004,227 | 32,302,374 | 144,656,992 | 204,108,421 | 176,003,211 | 236,410,795 | 245,203 | 371,132 |
| එකතුව | **9,163** | **9,155** | **2,029,756,024** | **2,331,420,514** | **619,173,905** | **570,936,619** | **412,544,588** | **464,251,547** | **2,114,709,286** | **2,902,357,132** | **2,562,050,170** | **3,366,608,679** | | |

## පරිපාලන පොදුකාර්ය පිරිවැය

| විෂයය මාතෘකාව | 2015 සඳහා වැය | 2016 සඳහා වැය |
|---|---|---|
| සාමාන්‍යය පරිපාලනය | 112,326,804 | - |
| මූල්‍ය පරිපාලනය | 37,124,288 | 35,174,074 |
| සැපයුම | 8,155,696 | 9,700,141 |
| ආරක්ෂාව | 39,375,551 | 43,615,013 |
| ප්‍රවාහන | 38,190,441 | 42,061,869 |
| HETC | 37,070 | - |
| විභාග | 25,473,843 | 30,261,135 |
| ඉගෙනුම් සම්පත් | 61,335,541 | 66,776,284 |
| සෞඛ්‍යය සේවා | 13,553,975 | 14,931,800 |
| ශාරීරික අධ්‍යාපනය | 23,949,366 | 28,109,502 |
| ශුභ සාධනය | 27,494,749 | 40,908,065 |
| නඩත්තු | 151,629,465 | 166,809,512 |
| නේවාසිකාගාර | 38,565,502 | 50,063,944 |
| කා.සං.ම. | 5,654,216 | 5,369,340 |
| පයෙර්ෂණ | 28,404,075 | 31,629,623 |
| තාක්ෂණ පීඨය | | 593,802 |
| KEID | 3,843,164 | 921,900 |
| ශිෂ්‍ය උපදේශන කායර්ාලය | 4,060,159 | 4,010,615 |
| **එකතුව** | **619,173,905** | **570,936,619** |

| | රු. | රු. |
|---|---|---|
| | **2015** | **2016** |
| **ශිෂ්‍යයකු සඳහා** | | |
| **සාමාන්‍ය පිරිවැය** | **279, 608** | **367,734** |
| | 2,562,050,170 | 3,366,608,679 |
| | 9,163 | 9,155 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | එච්ඊඩී/බී/යූඕසී/6/16/04 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | 09 NOV 2017 | දිනය<br>திகதி<br>Date | 2017 ඔක්තෝබර් 27 දින |

10 NOV 2017

උපකුලපති

කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත .

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

පිටපත්-:
1. ලේකම් -උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය.
2. ලේකම් -මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.
3. සභාපති -විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

B SAIA

VC

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/බී/යූඕසී/6/16/04 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 ඔක්තෝබර් 27 දින

උපකුලපති
කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට පටහැනිව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යාවරයාගේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව කළම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් නමින් ඇපයෙන් සීමිත සමාගමක් 2013 වර්ෂයේ දී 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි.

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාපීඨයේ පීඨාධිපති ඇතුළු කථිකාචාර්යවරුන් 09 දෙනෙකු මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයත්වය දරන බැවින් විශ්වවිද්‍යාලයේ පූර්ණ පාලන බලය සහිතව පවතින පරිපාලිත සමාගමක් බව පැහැදිලි වේ. ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමග සීමිත කලම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

මෙම සමාගමේ ප්‍රධාන කාර්යාලය කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා විශ්වවිද්‍යාලය සතුව පවතින පරිගණක උපාංග ඇතුලු අනෙකුත් භෞතික හා මානව සම්පත් භාවිතා කර ඇති නමුත් විශ්වවිද්‍යාලය සතු දේපළ භාවිතය පිළිබඳ එකඟතා ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සම්පත් භාවිතය වෙනුවෙන් රු.191,839 ක මුදලක් පමණක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වූ රු.35,296,230,000 ක් වටිනා ඉඩම්වල නීත්‍යානුකූල හිමිකම තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පු සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ලබාගෙන නොතිබු අතර පවරා ගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින බව උපකුලපතිවරයා විසින් 2017 අගෝස්තු 17 දින මා වෙත වාර්තා කර තිබුණි.

2.3 ලැබිය යුතු ගිණුම්

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍යා ප්‍රකාශනවල පෙන්වා ඇති ණය ශේෂයන්ගෙන් එකතුව රු.782,831 ක ණය ශේෂ 12 ක් වර්ෂ 03 සිට වර්ෂ 18 ත් අතර කාලයක් ගතවී තිබුණද ඒවා අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) වෛද්‍ය පීඨයේ සේවකයින් 04 දෙනෙකු විසින් ලබාගත් ණය පියවීමකින් තොරව සේවයෙන් ඉවත්වී තිබූ අතර 2016 දෙසැම්බර් 31 දක්වා රු.288,399 ක ණය ශේෂයක් ඔවුන්ගෙන් අයවීමට තිබුණි. මෙම ණය මුදල් අදාල පුද්ගලයින්ට ලබාදී වර්ෂ 5 ත් වර්ෂ 9 ත් අතර කාලයක් ගතවී තිබුණද එම මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ආචාර්යවරුන් 30 දෙනෙකු විසින් ගිවිසුම් කඩකිරීම හේතුවෙන් රු.40,086,005 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. මින් ආචාර්යවරුන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.8,121,094 ක ශේෂය වර්ෂ 11 සිට වර්ෂ 38 දක්වා කාල පරාසයක් ගතවී තිබුණ ද කිසිදු මුදලක් අයකර නොතිබූ බව නිරීක්ෂණය විය.

2.4 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත II කොටස 15(V) වගන්තිය | යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පැවැත්විය යුතු පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාලයේ පීඨ 04 ක් විසින් පාඨමාලා 53 ක් පවත්වා තිබුණි. |

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය

---

| | |
|---|---|
| (i) XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියළුම නිළධාරීන් පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන නිළධාරීන් 743 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සනාථ කර නොගෙන වැටුප් හා දීමනා ලෙස රු. 1,375,562,712 ක් ගෙවා තිබුණි. |
| (ii) XXII වැනි පරිච්ඡේදයේ 18- 3 වගන්තිය | යම් තැනැත්තෙකුගේ වැඩ තහනම් කර තිබේ නම් ඔහුට විරුද්ධව පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කළ යුතුය. කොළඹ විශ්වවිද්‍යාලයේ කම්කරු සේවයේ නියුතුව සිටි පුද්ගලයෙක් 2005 දෙසැම්බර් 09 වන දින සිට අඩ වැටුප් සහිතව වැඩ තහනමකට ලක්ව ඇති අතර 2017 ජුනි මස 30 දින දක්වා වර්ෂ 11 යි මාස 06 ක් සඳහා අඩ වැටුප් ලෙස රු.1,885,809 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද අදාළ විනය පරීක්ෂණ කටයුතු අවසන්ව නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---

| | |
|---|---|
| මුදල් රෙගුලාසි අංක 371 හා 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) ලබාගත් අත්තිකාරම් මුදලින් අදාල කාර්යය කඩිනමින් නිමකොට අත්තිකාරම් පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 28 ක දි ලබාගෙන තිබු එකතු වටිනාකම රු.2,772,704 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා දින 47 සිට දින 326 ක් දක්වා කාලයක් ගතවී තිබුණි. |

(ii) වරකට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවත් ආයතනය විසින් රු.149,940 ක සිට රු.658,103 ක් දක්වා පරාසයක් තුළ සමාලෝචිත වර්ෂයේ අවස්ථා 07 කදී අත්තිකාරම් ලබා දී තිබුණි.

| | | |
|---|---|---|
| (ඇ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004 පුස/01 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | වාර්ෂිකව පුස්තකාල පොත් සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව රු.380,885,509 ක පුස්තකාල පොත් සහ වාර සඟරා සම්බන්ධයෙන් 2016 වර්ෂයේ වාර්ෂික පොත් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ප්‍රවාහන පහසුකම් හිමි තනතුරකට අයත් නොවන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු (ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක) වෙනුවෙන් 2015 වර්ෂයේ සිට වාහනයක් සහ මාසික ඉන්ධන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබාදුන් ඉන්ධන වටිනාකම රු.337,720 ක් විය. |

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නොවූ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක තනතුර සඳහා 2015 සැප්තැම්බර් 9 වන දින පැවති 499 වන පාලක සභා රැස්වීමේදී ගත් තීරණයක් ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ පරිපාලන අරමුදලින් රු.1,050,000 ක් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.176,157,091 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.326,038,151 ක් විමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.149,881,060 කින් පිරිහී තිබුණි. රජයේ ප්‍රදාන රු. 338,034,192 කින් වැඩි වී තිබුණද

සේවක පාරිශ්‍රමික රු.444,958,302 කින් හා අනෙකුත් පොදු කාර්ය වියදම් රු. 343,767,748 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අතිරික්තය උච්චාවචනයන් සහිතව වර්ධනය වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී විශ්වවිද්‍යාලයේ දායකත්වය 2012 වර්ෂයේ සිට අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂය වන විට රු.2,968,791,856 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

විශ්වවිද්‍යාලය විසින් ලබාදුන් තොරතුරු අනුව විශ්වවිද්‍යාලයේ අරමුණු වනුයේ ඉගැන්වීම් කටයුතු සඳහා නවීනතම තාක්ෂණය භාවිතය, අධ්‍යාපන පාඨමාලාවල තත්ත්වය ජාත්‍යන්තර මට්ටම දක්වා ඉහළ නැංවීම, ඉහළ පර්යේෂණ මට්ටමක් ඇති කිරීම සඳහා පහසුකම් පුළුල් කිරීම, විශ්වවිද්‍යාලයේ සමාජයීය වටපිටාව ඉහළ නැංවීම, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල දක්ෂතාවන් ශක්තිමත් කිරීම, කළමනාකරණ පද්ධති ඉහළ නැංවීම සහ සමාජයීය යහපත තකා දැනුම හා පළපුරුද්ද යොදාගැනීම වේ.

එම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අයත් සංයුක්ත සැලැස්මෙහි ප්‍රධාන කාර්යසාධන නිර්ණායක ලෙස දක්වා තිබූ නිර්ණායක 06 ක් කෙරෙහි විගණනයේදී අවධානය යොමු වූ අතර එම කරුණු වන කර්මාන්ත සහයෝගිතාවය සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම, ප්‍රසිද්ධ සමුළු පැවැත්වීම, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පොත් ප්‍රසිද්ධ කිරීම, විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය හුවමාරු වැඩසටහන් යටතේ විදේශ සංචාරවල නිරතවීම, පශ්චාත් උපාධි ශිෂ්‍යයන් විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ ජාත්‍යයන්තර තරඟ සඳහා ශිෂ්‍යයින් ඉදිරිපත් කිරීම යන නිර්ණායකයන්හි ප්‍රගතිය සියයට 8 සිට සියයට 50 දක්වා අතර පරාසයක අඩු අගයක් වූ අතර එම නිර්ණායකයන් යටතේ කාර්යසාධන ප්‍රගතිය වර්ධනය කරගැනීම කෙරෙහි තවදුරටත් අවධානය යොමු විය යුතුව තිබුණි.

(ආ) ලෝක ශ්‍රේණිගත කිරීම් අතර 2015 වර්ෂයේදී 2034 ස්ථානයේ සිටි කොළඹ විශ්වවිද්‍යාලය 2016 වන විට 2171 ස්ථානය දක්වා පසුබෑමක් නිරීක්ෂණය විය.

(ඇ) 2014, 2015 හා 2016 වර්ෂවල විද්‍යා පීඨය සහ වෛද්‍ය පීඨය සඳහා බඳවාගැනීමට හැකිව තිබූ අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 2015 දෙනෙක් වුවද බඳවාගෙන තිබුණේ ශිෂ්‍යයන් 1793 දෙනෙක් පමණක් වීම හේතුවෙන් ශිෂ්‍යයන් 222 දෙනෙකුට විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථා අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) 2014, 2015 හා 2016 වර්ෂ සඳහා කලා පීඨයට බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 550 දෙනෙකු ලෙස දක්වා තිබුණ ද එම වර්ෂ තුනෙහිදීම පිළිවෙලින් 596 දෙනෙකු, 739 දෙනෙකු හා 692 දෙනෙකු බඳවාගෙන තිබීමෙන් වර්ෂ 03 සඳහා බඳවාගත් අතිරික්ත ශිෂ්‍ය සංඛ්‍යාව එකතුව 377 දෙනෙකු විය. විශ්වවිද්‍යාලයට බඳවාගැනීමට හැකි ශිෂ්‍ය සංඛ්‍යාව වසර ගණනාවකට පෙර තීරණය කර තිබූ අතර එම සංඛ්‍යාව කාලීනව සංශෝධනය කිරීමට කළමනාකාරීත්වය අවධානය යොමු කර නොතිබීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භෞතික පොත් පරීක්ෂාවට අනුව රු.3,292,524 ක් වටිනා පොත් 27,367 ක් අස්ථාන ගත වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී පොත් 3,298 ක වටිනාකම වූ රු.499,628 ක් ගිණුම්වලින් ලියාහැරීම හැර ඒ සම්බන්ධයෙන් වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය වෙත ලබාදුන් රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානවලින් රු.140,910,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි වී තිබුණු අතර ඒ තුළ ඇතුළත් රු.107,590,000 ක් ඉකුත් වර්ෂ ගණනාවක සිට අදාළ අරමුණු සඳහා වැය කිරීමකින් තොරව ඉතිරි කර තිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

නිසි ලෙස පුරෝකථනය කළ වැය ඇස්තමේන්තුවකින් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදි රු.297,750 ක වියදම් සඳහා අවස්ථා 41 ක දී රු.761,350 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

4.4 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන විශ්වවිද්‍යාලය සතුව 2016 දෙසැම්බර් 31 දිනට පැවති අරමුදල් ගිණුම් 29 කට අදාළ එකතුව රු. 23,863,768 ක් අදාළ කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල තොග සමීක්ෂණ වාර්තාව අනුව ගබඩාව තුළ චලනය නොවන තොග හා සෙමින් චලනය වන තොග පිළිවෙලින් රු.165,518 ක් හා රු.259,760 ක් විය.

(ඇ) පුස්තකාලයෙන් පොත් වංචනික අයුරින් බැහැරගෙන යාම වැළැක්වීම සඳහා පුස්තකාල දොරටුව අසල සවිකර තිබෙන ආරක්ෂිත විද්‍යුත් ගේට්ටුව 2016 පෙබරවාරි 08 දින සිට විගණිත දිනය වූ 2017 මැයි 09 දින දක්වා වර්ෂයකට අධික කාලයක් අක්‍රිය වී තිබුණද එය අළුත්වැඩියා කර නොතිබුණි.

4.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වාගෙන යනු ලබන පොත්හල, බදු දීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව බදුකරුවෙකු තෝරාගෙන තිබුණි. පොත්හල පවත්වාගෙන යන වර්ග අඩි 685 ක ගොඩනැගිල්ලෙහි තක්සේරු කුලිය නොසළකා 2008 සැප්තැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා කාලය තුළ එකම ආයතනයක් වෙත බදු දී තිබීම නිසා රු.966,668 ක ආදායමක් අහිමි වී තිබුණි. තවද එම පරිශ්‍රය තුළ පිහිටි බැංකුවක් සහ කිරිහල් දෙකක් වෙනුවෙන් කිසිදු බදු මුදලක් අයකර නොතිබුණි.

(ආ) 2016 මාර්තු 15 දින සිට 2018 මාර්තු 14 දින දක්වා කාලය වෙනුවෙන් විශ්වවිද්‍යාලවල ආරක්ෂක සේවාව සැපයීම සඳහා ලංසු කැඳවීම වෙනුවෙන් පිළියෙල කර තිබුණු පිරිවිතරයන්හි විශ්වවිද්‍යාලවල ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක පළපුරුද්ද සපුරා තිබිය යුතු බවට ඇතුළත් කර තිබුණු කොන්දේසිය හේතුවෙන් ඉදිරිපත්ව තිබුණු ලංසු අතරින් ලංසු 03 ක් ප්‍රතික්ෂේප වී තිබුණි. ඒ තුල ඇතුළත් දෙවන අවම මිල ගණන වූ රු.41,288,400 ක මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුව ප්‍රතික්ෂේප වී තිබීම හේතුවෙන් පස්වන අවම මිල ගණන වූ රු.44,454,896 කට ලංසුව ඉදිරිපත් කර තිබුණු ආයතනයට ප්‍රසම්පාදනය පිරිනැමීමට සිදු වී තිබුණි. ඒ අනුව එක් වර්ෂයක් සඳහා රු.3,666,496 ක් බැගින් 2016 මාර්තු සිට 2018 මාර්තු මාසය දක්වා රු.7,332,992 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මහල් 05 කින් යුත් සුජාතා ජයවර්ධන කාන්තා නේවාසිකාගාරයේ වැසිකිලි 50 ක් හා නාන කාමර 30 ක් නවීකරණය කිරීම සඳහා රු.25,359,367 ක (වැට් සහිත) මුදලකට පුද්ගලික සමාගමක් සමඟ 2013 දෙසැම්බර් 24 දින ගිවිසුමට එළඹ තිබුණි. වැඩ ප්‍රමාද කිරීමේ හේතුවෙන් 2015 ජුනි 16 දින විශ්වවිද්‍යාලය විසින් අදාල කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කළ බව කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබුණි. එසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය පරිදි ලබාගෙන ඇති රු.1,132,114 ක් වටිනා කාර්යසාධන ඇපකරය, කල් ඉකුත්වීමට පෙර විශ්වවිද්‍යාලය වෙත අයකරගත යුතුව තිබුණද එය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

ඉහත කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීමෙන් අනතුරුව රු.11,197,072 ක්වූ ඉතිරි වැඩ නිමකරගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම වෙනුවට, 2015 වර්ෂයේ ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකු වෙත මහල් 5 හි ඉතිරි ඉදිකිරීම් වැඩ වෙන වෙනම පවරා තිබුණි.

(ඈ) සුජාතා ජයවර්ධන නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිල්ල, හැව්ලොක් නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිලි, බ්ලොට් ෆෝමේන් නේවාසිකාරයේ ඉදිරිපස ගොඩනැගිල්ලේ පහළ මාලය සහ පිටුපස මැද ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය නිසිපරිදි යොමුවී නොතිබූ බැවින් මෙම නේවාසිකාගාර භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතියද එහි සිසුන් නේවාසිකව සිටින බව නිරීක්ෂණය විය.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 325ක් පැවතුණි. ආචාර්යවරුන්ගේ පුරප්පාඩු 111 ක් පැවතීම හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරු 379 දෙනෙකුගේ සේවය ලබාගැනීම වෙනුවෙන් රු.29,406,870 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) කාලීනව වැදගත් නොවන යතුරු ලේඛක තනතුරු 05 ක් සහ ලඝු ලේඛක තනතුරු 17 ක් පුරප්පාඩුව පැවති අතර එම තනතුරු වෙනුවට කාලීනව වැදගත් වන තනතුරු ඇතිකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

5.2 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ වැය විෂයයන් 20 ක අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 100 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | දේපළ අයිතිය තහවුරු කර නොගැනීම, වත්කම් නඩත්තු කිරීම හා අපහරණය පිළිබඳ දුර්වලතා පැවතීම. |
| (ආ) | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය පියවර නොගැනීම. |
| (ඇ) | අරමුදල් පවත්වාගෙන යාම | අරමුදල් පිහිටවූ නිශ්චිත කාර්යයන් සඳහා නොයෙදවීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | අදාල ලිපිගොනු විධිමත්ව නඩත්තු නොකිරීම සහ අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම. |
| (ඉ) | කාර්ය මණ්ඩල පරිපාලනය | අධ්‍යයන කාර්ය මණ්ඩලය පැමිණීම සටහන් නොකිරීම. |
| (ඊ) | පුස්තකාල පරිපාලනය | විධිමත් පරිදි පුස්තකාල පොත් සමීක්ෂණ නොපැවැත්වීම, සංසන්දනාත්මක ලේඛන විධිමත්ව පවත්වාගෙන නොයාම. |
| (උ) | මෙහෙයුම් පාලනය | ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු කරගෙන යාමට සුදුසු පරිසරයක් පවතින ආකාරයට නේවාසිකාගාර පවත්වාගෙන නොයාම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

## විගණකාධිපති

## විගණකාධිපති දෙපාර්තමේන්තුව

**කොළඹ විශ්ව විද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පණතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුර**

| | | |
|---|---|---|
| **2.2** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** | |
| **2.2.1** | **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන** | |
| | 1978 අංක16 දරණ විශ්වවිද්‍යාල පනතට පටහැනිව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ නිදෙර්ශ සහිතව අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව කළම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් නමින් ඇපයෙන් සීමිත සමාගමක් 2013 වෂර්යේ දී 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබුණි.<br><br>කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපති ඇතුළු කථිකාචායර්වරුන් 09 දෙනෙකු මෙම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දරණ බැවින් විශ්වවිද්‍යාලයේ පූණර් පාලන බලය සහිතව පවතින පරිපාලිත සමාගමක් බව පැහැදිලි වේ.ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සීමිත කළම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද , 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෂර්ය සඳහා ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.<br><br>මෙම සමාගමේ ප්‍රධාන කායර්ාලය කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා විශ්වවිද්‍යාලය සතුව පවතින පරිගණක උපාංග ඇතුළු අනෙකුත් භෞතික හා මානව සම්පත් භාවිතා කර ඇති නමුත් විශ්වවිද්‍යාලය සතු දේපළ භාවිතය පිළිබද එකඟතා ගිවිසුමකට ඇතුළත් වී | සෙල් සමාගම ඇපයෙන් සීමිත සමාගමක් ලෙස පිහිටුවා ඇති ආයතනයක් වන අතර එම ආයතනයේ මූල්‍ය පරිපාලනය වෙනම අධ්‍යක්ෂක මණ්ඩලයක් මඟින් සිදු වේ. එසේම වෙනම බැංකු ගිණුම් පවත්වාගෙන යන අතර අරමුදල් රැස් කිරීමද එම ගිණුම් මඟින්ම සිදුවේ. මෙම ආයතනයේ මූල්‍ය පරිපාලනය සහ ගිණුම් කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී විසින් සෘජුව මෙහෙයවීම සිදු නොවන නිසා ගිණුම් ඒකාබද්ධ කළ නොහැක.<br><br>එසේ වුවද දැනට මෙම ගැටළු සියල්ල පිළිබඳව සලකා බැලීම සඳහා පාලක සභා උප කමිටුවක් මේ වන විට පත් කර ඇති අතර එහි නිදෙර්ශ මත අවශ්‍ය ක්‍රියාමාගර් ගනු ලබන බව දන්වමි. |

| | | |
|---|---|---|
| | නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සම්පත් භාවිතය වෙනුවෙන් රු.191,839 ක මුදලක් පමණක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා නොතිබුණි. | |
| **2.2.2** | **විගණනය සඳහා සාක්ෂි නොවීම** | |
| | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වූ රු.35,296,230,000 ක් වටිනා ඉඩම් වල නීත්‍යානුකූල හිමිකම තහවුරු කිරීම සඳහා හිමිකම් ඔප්පු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලබා ගෙන නොතිබූ අතර පවරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව උපකුලපතිවරයා විසින් 2017 අගෝස්තු 17 දින මා වෙත වාතර්‍ා කර තිබුණි. | විශ්වවිද්‍යාලය විසින් මේ වන විට භුක්ති විඳින ඉඩම්වල නීත්‍යානුකූල හිමිකම පවරා ගැනීමට අදාළ ඉල්ලීම් ප්‍රාදේශීය ලේකම්, තිඹිරිගස්යාය මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව හිමිකම පවරා දීම සඳහා වූ ඉල්ලීම සලකා බලමින් පවතින බව පසු විපරම් කිරීමේ දී තහවුරු වී ඇති අතර මේ වනවිට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාතර්මේන්තුව විසින් අදාළ ලියකියවිලි ජනාධිපති කායර්ාලයට යොමු කර ඇති බව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාතර්මේන්තුවෙන් වාචිකව දන්වා ඇත. |
| **2.3** | **ලැබිය යුතු ගිණුම්** | |
| | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |

| | | |
|---|---|---|
| | (අ) මුලා ප්‍රකාශන වල පෙන්වා ඇති ණය ශේෂයන්ගෙන් එකතුව රු.782,831ක ණය ශේෂ 12ක් වෂර් 03 සිට වෂර් 18 ත් අතර කාලයක් ගත වී තිබුණද ඒවා අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම ණය ශේෂ පාලක සභාවේ අනුමැතිය මත කපා හැර ඇත. |
| | (ආ) වෛද්‍ය පීඨයේ සේවකයින් 04 දෙනෙකු විසින් ලබා ගත් ණය පියවීමකින් තොරව සේවයෙන් ඉවත් වී තිබූ අතර 2016 දෙසැම්බර් 31 දක්වා රු.288,399 ක ණය ශේෂයක් ඔවුන්ගෙන් අයවීමට තිබුණි.මෙම ණය මුදල් අදාළ පුද්ගලයන්ට ලබා දී වෂර් 5 ත් වෂර් 9 ත් අතර කාලයක් ගත වී තිබුණ ද එම මුදල් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | වෛද්‍ය පීඨයේ සේවකයින් හතර දෙනෙකු විසින් ලබා ගෙන ඇති රු. 288,399 ක් වු ණය ශේෂ දීඝර් කාලයක් සිට පැවත එන අතර අදාළ සේවකයින්ගේ තොරතුරු සොයා ගැනීමට නොහැකි වීම මත අය කර ගැනීමට නොහැකි වී ඇත. |

| | | |
|---|---|---|
| | (ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ආචාර්යවරුන් 30 දෙනෙකු විසින් ගිවිසුම් කඩකිරීම හේතුවෙන් රු.40,086,005 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. මින් ආචාර්යවරුන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.8,121,094 ක ශේෂය වසර 11 සිට වසර 38 දක්වා කාල පරාසයක් ගත වී තිබුණ ද කිසිදු මුදලක් අයකර නොතිබූ බව නිරීක්ෂණය විය. | **ගිවිසුම් හා බැඳුම්කර කඩවී ඇති කිසිදු මුදලක් මේ දක්වා අයකර ගැනීම අපහසු වී ඇති ආචාර්යවරුන් 08 දෙනාගේ විස්තර පහත පරිදි වේ.**<br><br>(table below)<br><br>උක්ත ආචාර්යවරුන් 08 දෙනාගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා නීතිපති දෙපාතර්මේන්තුව නඩු පැවරීමට කටයුතු කලද සිතාසි යැවීම සඳහා ලිපිනයන් සොයා ගැනීමට නොහැකි වීම නිසා කටයුතු ප්‍රමාද වෙමින් පවතී.<br><br>මෙම අය අතරින් අංක 08 යටතේ නම සඳහන් ඊ.සී. වසන්තන් මහතාගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා ඇපකරුවන් වෙත නීතිපති දෙපාතර්මේන්තුව එන්තර වාසි යවා ඇත.<br><br>**අනෙකුත් ආචාර්යවරුන් 22 පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.** |

| | ආචාර්යවරයාගේ නම | අයවිය යුතු මුදල (රු.) |
|---|---|---|
| 01. | ආචාර්ය ඩී.එස්. විලියම්ස් මහතා | 201,789.00 |
| 02. | ආර්.එම්.එච්. සූරියපාල මහතා | 197,275.80 |
| 03. | ආචාර්ය ජී. වෙල්ලප්පා මහත්මිය | 300,202.01 |
| 04. | ආචාර්ය ඩී. නුගේගොඩ මහත්මිය | 611,849.49 |
| 05. | ආචාර්ය එම්. විලියම්ස් මහත්මිය | 74,428.37 |
| 06. | ආචාර්ය එන්. සිවනන්තන් මහතා | 297,060.52 |
| 07. | ඩී.පී.ඊ. වික්‍රමසූරිය මහත්මිය | 209,417.95 |
| 08. | ඊ.සී. වසන්තන් මහතා | 6,229,073.24 |
| | **මුළු මුදල** | **8,121,096.38** |

| | ආචාර්ය වරයාගේ නම | අය වීමට තිබූ මුළු මුදල (රු.) | මේ දක්වා ගෙවා ඇති මුදල | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| 01 | එම්.එස්. පෙරේරා මහත්මිය | 4,600,497.26 | 4,600,497.26 | මුළු මුදල සම්පූණර්යෙන් ගෙවා නිමකර ඇත. |
| 02 | පී. තෝරදෙණිය මහත්මිය | 1,891,377.55 | 569,611.45 | බැඳුම්කර වාරික වශයෙන් ගෙවා ගෙන යමින්පවතින අතර තවදුරටත් රු. 1,321,766.10 මුදලක් අයවීමට පවතී. ඇපකරුවන්ට දැනුම් දී ඇත. නඩු පැවරීමට නීතිපති දෙපාතර්මේන්තුවට යවා ඇත. |
| 03 | ආචායර් ටී.එම්.කේ.පී තෙන්න කෝ-න් මහත්මිය | 1,498,430.43 | 881,243.40 | බැඳුම්කර වාරික වශයෙන් ගෙවා ගෙන යමින් පවතී. තවදුරටත් රු. 617,187.03 ක මුදලක් අයවීමට පවතී. |
| 04 | එච්.එම්. අලිසබ්‍රි මහතා | 4,689,725.84 | 3,677,262.04 | බැඳුම්කර වාරික වශයෙන් ගෙවා ගෙන යමින් පවතී. තවදුරටත් රු. 1,012,463.80 ක මුදලක් අය වීමට පවතී. |
| 05 | ආචායර් කේ.සී. | | 2,444,208.32 | බැඳුම්කර වාරික වශයෙන් ගෙවා ගෙන යමින් පවතී. තවදුරටත් රු. 976,608 මුදලක් අයවීමට පවතී. . |

| | | | | |
|---|---|---|---|---|
| | ලියනගේ මහතා | 3,420,816.45 | | |
| 06 | ටී. උමාශංගර් මහතා | 2,180,627.43 | 1,795,673.89 | බැඳුම්කර මුදල සම්පූණර්යෙන් ගෙවා නිමවා ඇත. ඊට අදාළ පොළිය වන රු.384,953.54 ක මුදල අය කර ගැනීමට පවතී. |
| 07 | ඊ.එස්. බැද්දෙවෙල මහත්මිය | 2,609,984.75 | 2,517,367.20 | බැඳුම්කර වාරික වශයෙන් ගෙවා ගෙන යමින් පවතී. තවදුරටත් රු.92,617.55 ක් අයකර ගැනීමට පවතී. |
| 08 | ආචායර් එස්.ජේ. ආබ්දීන් මහත්මිය | 2,680,446.84 | 967,447.46 | බැඳුම්කර වාරික වශයෙන් ගෙවා ගෙන යමින් පවතී. ඉතිරි මුදල් වන රු. 1,712,999.38 ක මුදල අය කර ගැනීම සඳහා ආබ්දීන් මහත්මිය හා ඇපකරුවන් වෙත සිහිකැඳවීමේ ලිපි යවා අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| 09 | එස්.එම්.එෆ්. හේරත් මහත්මිය | 2,428,879.46 | 1,689,931.95 | රු.738,947.51 ක මුදලක් තවදුරටත් අයකර ගැනීමට ඇත. ඉතිරි මුදල අයකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| 10 | එස්.කේ. හේවාමාන්න මහත්මිය | 2,877,828.30 | 1,687,493.42 | රු.1,190,334.90 ක මුදලක් අය කර ගැනීමට පවතී.<br>ඉතිරි මුදල අයකර ගැනීම සඳහා තව දුරටත් කටයුතු කරමින් පවතී. |
| 11 | එම්.එස්.ආර්. ප්‍රනාන්දු මහතා | 653,961.21 | 447,880.76 | රු. 206,080.45 ක මුදලක් අයකර ගැනීමට පවතීඉතිරි මුදල අයකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී. |
| 12 | ආර්.ඊ. කාසිවෙට්ටි මහත්මිය | 3,090,743.82 | 622,597.28 | රු. 2,468,146.54 ක මුදලක් අයකර ගැනීමට පවතී. ඉතිරි මුදල අයකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී. |
| 13 | කේ.එම්.සී.ෙ කමල්ගොඩ මහත්මිය | 1,805,496.28 | 398,286.47 | රු. 1,407,209.81 ක මුදලක් අයකර ගැනීමට පවතී. ඉතිරි මුදල අයකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී. |
| 14 | කේ.එම්.එන්. සේනානායක මහත්මිය | 1,223,239.31 | 980,299.54 | රු. 242,939.77 ක මුදලක් අයකර ගැනීමට පවතී.ඉතිරි මුදල අයකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී. |
| 15 | ඩබ්.ඩබ්. පත්මසිරි | 3,066,077.36 | 2,842,981.68 | රු. 223,095.68 ක මුදලක් අයකර ගැනීමට පවතී.ඉතිරි මුදල අයකර |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | මහතා | | | ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී. |
| | 16 | කේ.එන්. ජයසිංහ මහතා | 6,050,792.18 | 2,898,202.50 | රු.3,152,589.68 ක මුදලක් අයකර ගැනීමට පවතී.නඩු පැවරීම සඳහා අදාළ ලියකියවිලි නීතිපති දෙපාතර්මේන්තුව වෙත යවා ඇත. |
| | 17 | ජී.කේ. මාරසිංහ මහතා | 392,438.07 | 293,338.00 | අයවීමට තිබූ ඉතිරි මුදල වන රු. 99,100.07 ක මුදල අථර් සාධක අරමුදලින් අයකරගෙන ඇත. |
| | 18 | ඒ.ජේ.යූ. පෙරේරා මහතා | 256,085.06 | - | ඒ.ජේ.යූ. පෙරේරා මහතාගේ කැමත්ත ප්‍රකාශිත ලිපිය ප්‍රමාණවත් නොමැති බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් දන්වා එවා ඇති අතර ඒ මහතා වෙත විද්‍යුත් තැපැල සහ ලිපි මඟින් දන්වා ඒ ලිපිය ලබා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |
| | 19 | වෛද්‍ය යූ.එස්. රාජපක්ෂ මහත්මිය | 8,660,596.64 | - | ගිවිසුම්ගත මුදල අයකර ගැනීම සම්බන්ධව ඇතිවී ඇති ගැටළුකාරී තත්ත්වය පිළිබඳ නීතිපතිදෙපාතර්මේන්තුවෙන් විමසා ඒ අනුව කටයුතු කිරීමට 2017/06/14 දිනැති 524 වන පාලක සභාවේදී තීරණය කරන ලදී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20 | වෛද්‍ය ඩී.එච් ද සිල්වා මහ | 1,946,676.92 | 798,102.27 | රු 1,148,574.75 ක මුදලක් අයවීමට පවතී. ඉතිරි මුදල අයකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී. | |
| 21 | එම්.ජේ.එම්. රාසි මහතා | 3,607,927.25 | 1,520,837.48 | රු. 2,087,089.77 ක මුදලක් අයවීමට පවතී. ඉතිරි මුදල වාරික වශයෙන් ගෙවීමට කැමත්ත පලකර දන්වා යවා ඇත. | |
| 22 | වී.වාසු මහත්මිය | 2,593,234.62 | 2,380,218.03 | රු. 213,016.59 ක මුදලක් අයවීමට පවතී. ඉතිරි මුදල අයකර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් පවතී. | |
| | **මුළු එකතුව** | **62,225,883.03** | **29,412,983.14** | | |

| | | | |
|---|---|---|---|
| **2.4** | **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම** | | |
| | පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය. | | |
| | **නීති රීති, රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නො වීම** | |
| | (අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත II කොටස 15 (V) වගන්තිය | යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් පැවැත්විය යුතු පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විශ්වවිද්‍යා | සහතික පත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලා වලට සනාතන සභාවේ අනුමැතිය ප්‍රමාණවත් වේ. ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අවශ්‍ය නොවේ. |

| | | | |
|---|---|---|---|
| | | ලයේ පීඨ 04 ක් විසින් පාඨමාලා 53 ක් පවත්වා තිබුණි. | |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය | | |
| | (i) XX වැනි පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කායර් මණ්ඩලයේ සියළුම නිළධාරීන් පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන නිළධාරීන් 743 දෙනෙකු | අධ්‍යයන කායර් මණ්ඩලයේ රාජකාරී කටයුතු පැය 08 ට සීමා කළ නොහැකිය. එසේම අදාළ ආචායර්වරුන් විසින් පවත්වන දේශන සඳහා සහභාගි වන සිසුන්ගේ අත්සන් ලබා ගැනීමට සිදුවන අතර එය අදාළ අචායර්වරයා දේශන වලට පැමිණි බව සනාථ කරන්නකි.එසේම සනාතන සභාව විසින් සම්මත කර ඇති නියාමයන් අනුව ආචායර්වරුන් කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | | ගේ පැමිණීම හා නිවාඩු සනාථ කර නොගෙන වැටුප් හා දීමනා ලෙස රු.1,375,562,712 ක් ගෙවා තිබුණි. | |
| | (ii) XXII වැනි පරිච්ඡේදයේ 18- 3 වගන්තිය | යම් තැනැත්තෙකුගේ වැඩ තහනම් කර තිබේ නම් ඔහුට විරුද්ධව පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කළ යුතුය.කොළඹ විශ්වවිද්‍යා | ආයතන සංග්‍රහයේ xxii වැනි පරිච්ඡේදයේ සඳහන් පරිදි යම් තැනැත්තෙකුගේ වැඩ තහනම් කර තිබේ නම් ඔහුට විරුද්ධව පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කළ යුතුය.<br>විශ්වවිද්‍යාලයේ කම්කරු තනතුරක සේවය කළ H.G.J. දිල්රුක් මහතා ඇතුළු තවත් සේවකයින් දෙදෙනෙකු සම්බන්ධයෙන් පැවති මූලික පරීක්ෂණයේ වාතර්ාව සලකා බලා 09-12-2006 දිනැති ලිපිය මඟින් ඔහුගේ වැඩ තහනම් කර ඇති අතර 2006-04-19 දිනැති චෝදනා පත්‍රය නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා පරීක්ෂණ නිළධාරී ලෙස විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඩබ්ලි කරුණාරත්න මැතිතුමාද පැමිණිල්ල මෙහෙයවීමේ නිළධාරි ලෙස නීතිඥ රියාඩ් අමීන් මහතාද, දිල්රුක් මහතාගේ ආරක්ෂක නිළධාරී ලෙස නීතිඥ D.K. ධනපාල මහතාද පත් කරන ලදී.<br>කරුණු මෙසේ තිබියදී දිල්රුක් මහතා විසින් වැඩ තහනම් කර ඇති කාලයට අඩ වැටුප් වෙනුවට සම්පූණර් වැටුප ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් ගරු අභියාචනාධිකරණයේ අංක CA(Writ) 736/2010 යන නඩුව පවරන ලද අතර ඔහු වෙත ගෙවමින් පැවති අඩ වැටුප් නතර කරන ලෙසට අතුරු නියෝගයක් අභියාචනාධිකරණයෙන් නිකුත් කිරීමක් සිදු නොවූ බැවින් කොළඹ විශ්වවිද්‍යාලය මඟින් දිල්රුක් මහතා වෙත අඩ වැටුප් ගෙවීම සිදු කරන ලදී.<br>කෙසේ වුවද ඔහුගේ CA(Writ) 736/2010 යන නඩුවේ 2015.09.28 දිනැති නියෝගය අනුව ඔහු විසින් අයැද තිබූ සියලු සහනයන් ප්‍රතික්ෂේප කරමින් නඩුව නිශ්ප්‍රභා කර ඇත.<br>ඒවන විට අඩ වැටුප් සහිතව ඔහුගේ වැඩ තහනම ක්‍රියාත්මකව පැවති බැවින් හිඟ වැටුප් රහිතව නැවත සේවයේ පිහිටුවීමටත් ඔහු ඊට එකඟ නොවන්නේ නම් තමා විසින්ම සේවය අවසන් කළ සේ |

| | | | |
|---|---|---|---|
| | | ලයේ කම්කරු සේවයේ නියුතුව සිටි පුද්ගලයෙක් 2005 දෙසැම්බර් 09 වන දින සිට අඩ වැටුප් සහිතව වැඩ තහනමකට ලක්ව ඇති අතර 2017 ජුනි මස 30 දින දක්වා වසර 11 මාස 06 ක් සඳහා අඩ වැටුප් ලෙස රු.1,885,809 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ | සලකා(Constructively terminated by him) කටයුතු කරන බවත් 2015.12.09 දින පැවති 503 වන පාලක සභාවේදී තීරණය කර ඇත.<br>ඒ අනුව ඔහු විසින් කොන්දේසි සහිතව වැඩ භාරගැනීමට එකඟ වුවද එය විශ්වවිද්‍යාලය පිළිනොගත් අතර ඔහු විසින් ඒ පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් ගොනු කරන ලදී. ඔහු වෙත ලබාදෙන ලද සහනයන් ඔහු විසින්ම ප්‍රතික්ෂේප කර ඇති බවත්, විශ්වවිද්‍යාලය විසින් ඔහුගේ මූලික අයිතිවාසිකම් කඩකර නොමැති බවත් මානව හිමිකම් කොමිෂන් සභාවේ විශේෂ අවධානයට යොමු කරමින් නැවත සේවයට වාතර්‍ා කරන තෙක් ඔහුට දැනට ගෙවන අඩ වැටුප් නතර කිරීමට නියෝගයක් ලබාදෙන ලෙස විශ්වවිද්‍යාලය විසින් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.<br>ඒ සම්බන්ධව තවමත් නියෝගයක් නොමැති හෙයින් 2017.07.12 දින පැවති 525 වන පාලක සභාවේදී සියලු කරුණු සලකා බලා දිල්රුක් මහතාට අඩවැටුප් ගෙවීම නතර කිරීමට තීරණය කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | | වුවද අදාළ විනය පරීක්ෂණ කටයුතු අවසන්ව නොතිබුණි. | |
| | | | |
| | (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | මුදල් රෙගුලාසි අංක 371 හා 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) ලබාගත් අත්තිකාරම් මුදලින් අදාළ කාර්යය කඩිනමින් නිම කොට අත්තිකාරම් පියවිය යුතු වුවත් සමාලෝචි | නියමිත කාලයේදී නොපියවන ලද අත්තිකාරම් පියවන ලෙස වාචිකව මෙන්ම හැකි සෑම විටම ලිඛිතව ද දැනුම් දී ඇත. පියවීම ප්‍රමාද වන්නේ හුදෙක්ම ප්‍රායෝගික ගැටළුකාරී තත්ත්වයන් මත වේ. එසේම අත්තිකාරම් පියවීම දීඝර් කාලයක් ප්‍රමාද වන්නේ නම් එම මුදල් වැටුපෙන් අය කරන බව දන්වා ලිපි යැවීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | | ත වෂර්යේ අවස්ථා 28 කදී ලබා ගෙන තිබූ එකතු වටිනාකම රු.2,772,704 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා දින 47 සිට දින 326 ක් දක්වා කාලයක් ගත වී තිබුණි. | |
| | | (ii)වරකට ලබාදිය හැකි උපරිම | මුදල් මඟින් අත්තිකාරම් ලබා දීමේදී වරකට උපරිම අත්තිකාරම් රු.100,000.00 දක්වා පමණක් ගෙවීමට දැනටමත් පියවර ගෙන ඇත. නමුත් ඇතැම් බාහිර ආයතන හා පුද්ගලයන් විසින් විශ්වවිද්‍යාලයට සපයනු ලබන භාණ්ඩ හා සේවා මත අත්තිකාරම් ගෙවීමට සිදු වන අවස්ථාවල දී පමණක් රු.100,000.00 ක උපරිමය ඉක්මවා අදාළ අනුමැතින්ට යටත්ව චෙක්පත් මඟින් පමණක් අත්තිකාරම් ගෙවීම සිදු කරයි. |

| | | | |
|---|---|---|---|
| | | අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවත් ආයතනය විසින් රු.149,940 ක සිට රු.658,103 ක් දක්වා පරාසයක් තුළ සමාලෝචිත වෂර්යේ අවස්ථා 07 කදී අත්තිකාරම් ලබා දී තිබුණි. | |
| | (ඇ) 2004 ජනවාරි 26 දිනැති අංක 2004 පුස/01 දරණ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මුදල් චක්‍රලේඛය | වාෂර්ිකව පුස්තකාල පොත් සමීක්ෂණ යක් පැවැත්විය යුතු වුවත් | පුස්තකාල පොත් සහ වාර සඟරා සඳහා සමීක්ෂණ කටයුතු මේ වන විට ආරම්භ කර පවත්වනු ලැබේ. මෙම කටයුතු කඩිනමින් නිම කිරීමට පියවර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | | මුල්‍ය ප්‍රකාශන අනුව රු.380,885,509 ක පුස්තකාල පොත් සහ වාර සඟරා සම්බන්ධයෙන් 2016 වර්ෂයේ වාර්ෂික පොත් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | |
| | (ඉ) 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 3/2015 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ප්‍රවාහන පහසුකම් හිමි තනතුරකට අයත් නොවන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු (ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 13/2015 සඳහන් නොවන තනතුරක් වන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක) වෙනුවෙන් වාහනයක් වෙන් කරන ලද්දේ 2015.11.19 වන දින පැවති 91 වෙනි කළමණාකරන කමිටුවෙන් හා 2015.12.09 වන දින පැවති 503 වෙනි පාලක සභා තීරණයට අනුවය. (ඇමුණුම අංක 1) |

| | | | |
|---|---|---|---|
| | | උපදේශක) වෙනුවෙන් 2015 වර්ෂයේ සිට වාහනයක් සහ මාසික ඉන්ධන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලබා දුන් ඉන්ධන වටිනාකම රු.337,720 ක් විය. | |
| **2.5** | **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු** | | |
| | අනුමත කායර් මණ්ඩලය තුළ ඇතුළත් නොවූ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක තනතුර සඳහා 2015 සැප්තැම්බර් 9 වන දින පැවති 499 වන පාලක සභා රැස්වීමේදී ගත් තීරණයක් ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ පරිපාලන අරමුදලින් රු.1,050,000 ක් ගෙවා තිබුණි. | | කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය, සියළු පීඨයන් (Nine Faculties) සහ විශ්වවිද්‍යාලයට අනුබද්ධ සියළු ආයතන (Seven Institutes) සහ මධ්‍යස්ථාන (Centre) වලට අදාළ නීති කටයුතු සහ විනය කටයුතු වලට අදාළ කායර්යන් සලකා බලා 2015.09.09 වන දින පැවති 499 වන පාලක සභා රුස්වීමේදී ජ්‍යෙෂ්ඨ නීති උපදේශකයකුගේ සේවය ලබා ගැනීම සුදුසු බව නිගමනය කර නීති පීඨයේ හිටපු පීඨාධිපති එන්. සෙල්වකුමාරන් මහතාව වසරක කාලයක් සඳහා කායර් පැවරුම් පදනම මත පත් කිරීමට තීරණය කරන ලදී.<br>ඒ අනුව 2015.10.01 දින සිට වසරක් කායර් පැවරුම් මත රු.50,000.00 දීමනාවකට යටත්ව පත් කිරීමට තීරණය කරන ලදී .තවද ඔහු විසින් ලබා දෙන සේවය තව දුරටත් අගය කිරීමක් වශයෙන් 2016.04.22 පැවති |

| | | |
|---|---|---|
| | | 507 වන පාලක සභා රැස්වීමේදී ගන්නා ලද තීරණයකට අනුව තවත් රු.50,000 ක මුදලක් ගෙවීමට තීරණය කර ඇත.<br>ඒ අනුව දැනට ඒ මහතා 2016.10.01 දින සිට තවත් වසරක කාලයක් සඳහා කායර් පැවරුම් පදනම මත පත්කර ඇත. |
| **3.** | **මූල්‍ය සමාලෝචනය** | |
| **3.1** | **මූල්‍ය ප්‍රතිඵල** | |
| | ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වෂර්යේ මූල්‍ය ප්‍රතිඵලය රු.176,157,091 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වෂර්යේ අතිරික්තය රු.326,038,151 ක් වීමෙන් ඉකුත් වෂර්යට සාපේක්ෂව සමාලෝචිත වෂර්යේ මූල්‍ය ප්‍රතිඵලය රු.149,881,060 කින් පිරිහී තිබුණි.රජයේ ප්‍රදාන රු.338,034,192 කින් වැඩි වී තිබුණද සේවක පාරිශ්‍රමික රු.444,958,302 කින් හා අනෙකුත් පොදු කායර් වියදම් රු.343,767,748 කින් වැඩිවීම ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.<br>සමාලෝචිත වෂර්යේ සහ ඉකුත් වෂර් 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වෂර්යේ සිට 2016 වෂර්ය දක්වා අතිරික්තය උච්චාවචනයන් සහිතව වධර්නය වී තිබුණි.කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී විශ්වවිද්‍යාලයේ දායකත්වය 2012 වෂර්යේ සිට අඛණ්ඩව වධර්නය වී 2016 වෂර්ය වන විට රු.2,968,791,856 ක් වී තිබුණි. | |
| **4.** | **මෙහෙයුම් සමාලෝචනය** | |

| 4.1 | කාර්යසාධනය | |
|---|---|---|
| | විශ්වවිද්‍යාලය විසින් ලබාදුන් තොරතුරු අනුව විශ්වවිද්‍යාලයේ අරමුණු වනුයේ ඉගැන්වීම් කටයුතු සඳහා නවීනතම තාක්ෂණය භාවිතය, අධ්‍යාපන පාඨමාලා වල තත්ත්වය ජාත්‍යන්තර මට්ටම දක්වා ඉහළ නැංවීම, ඉහළ පයෙර්ෂණ මට්ටමක් ඇති කිරීම සඳහා පහසුකම් පුළුල් කිරීම, විශ්වවිද්‍යාලයේ සමාජයීය වටපිටාව ඉහළ නැංවීම, අධ්‍යයන හා අනධ්‍යයන කායර් මණ්ඩලවල දක්ෂතාවන් ශක්තිමත් කිරීම, කළමනාකරණ පද්ධති ඉහළ නැංවීම සහ සමාජයීය යහපත තකා දැනුම හා පළපුරුද්ද යොදාගැනීම වේ. | |
| | එම අරමුණ ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |
| | (අ) 2016 වෂර්යේ සිට 2020 වෂර්ය දක්වා කාලපරිච්ඡේදයට අයත් සංයුක්ත සැලැස්මෙහි ප්‍රධාන කායර්සාධන නිණර්ායක ලෙස දක්වා තිබූ නිණර්ායක 06ක් කෙරෙහි විගණනයේදි අවධානය යොමු වු අතර එම කරුණු වන කමර්ාන්ත සහයෝගීතාවය සඳහා කමර්ාන්ත ක්ෂේත්‍රය සහ විශ්වවිද්‍යාල අතර අවබෝධතා ගිවිසුම් ඇති කර ගැනීම, ප්‍රසිද්ධ සමුළු පැවැත්වීම, අධ්‍යයන කායර් මණ්ඩලය විසින් පොත් ප්‍රසිද්ධ කිරීම, විශ්වවිද්‍යාල අධ්‍යයන කායර් මණ්ඩලය හුවමාරු වැඩසටහන් යටතේ විදේශ සංචාර වල නිරත වීම, පශ්චාත් උපාධි ශිෂ්‍යයන් විසින් පයෙර්ෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම යන නිණර්ායකයන්හි ප්‍රගතිය 8% සිට 50% දක්වා අතර පරාසයක අඩු අගයක් වු අතර එම නිණර්ායකයන් යටතේ කායර්සාධන ප්‍රගතිය වධර්නය කරගැනීම කෙරෙහි තවදුරටත් අවධානය යොමු විය යුතුව තිබුණි. | මෙහි දක්වා ඇති කායර් සාධන නිනර්ායකයන්හි ප්‍රගතිය වැඩි දියුණු කර ගැනීමට ක්‍රියාමාගර් මේ වන විට ගෙන ඇත.<br>තවද 2016-2020 උපායමාගරීක සැලැස්ම සකස් කිරීමේදී KPI හි අපේක්ෂිත මට්ටම තීරණය කිරීමේදී සිදු වු දෝෂ හා එහි ඇති අනෙකුත් අඩුපාඩු සැලකිල්ලට ගෙන 2017 වෂර්යේදී කොළඹ විශ්වවිද්‍යාලය විසින් 2017-2021 නව උපායමාගරීක සැලැස්ම පිළියෙල කර ඇත. |

| | | |
|---|---|---|
| | | |
| | (ආ) ලෝක ශ්‍රේණිගත කිරීම් අතර 2015 වර්ෂයේදී 2034 ස්ථානයේ සිටි කොළඹ විශ්වවිද්‍යාලය 2016 වන විට 2171 ස්ථානය දක්වා පසුබෑමක් නිරීක්ෂණය විය. | මෙම ශ්‍රේණිගත කිරීම් සිදුවන්නේ විශ්වවිද්‍යාල වෙබ් අඩවියේ පළවන පුවත් විශ්ලේෂණය කිරීමෙනි. එම නිසා එම පුවත් කාල වකවානු අනුව වෙනස් වන බැවින් Webometrics Ranking ද වෙනස් විය හැකිය. ලෝකයේ පිළිගත් ශ්‍රේණිගත කිරීම වන්නේ Times and Education ආයතනයේ වර්ගීකරණය වන අතර ඒ අනුව කොළඹ විශ්වවිද්‍යාලය මුල් විශ්වවිද්‍යාල 1000 අතර සිටින අතර ශ්‍රී ලංකාවේ එවැනි ස්ථානයක පසු වන්නේ කොළඹ විශ්වවිද්‍යාලය පමණි. |
| | (ඇ) 2014, 2015 හා 2016 වර්ෂ වල විද්‍යා පීඨය සහ වෛද්‍ය පීඨය සඳහා බඳවා ගැනීමට හැකිව තිබූ අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 2015 දෙදෙනෙක් වුවද බඳවාගෙන තිබුණේ ශිෂ්‍යයන් 1793 දෙනෙක් පමණක් වීම හේතුවෙන් ශිෂ්‍යයන් 222 දෙනෙකුට විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථා අහිමි වී තිබූ බව නිරීක්ෂණය විය. | විශ්වවිද්‍යාලයේ සියළුම පාඨමාලා සඳහා සිසුන් තෝරා එවනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. එය අදියර කිහිපයකින් සිදුවේ.ඒ සෑම අවස්ථාවකදීම විද්‍යා පීඨයට තෝරා එවනු ලබන සිසුන් සියල්ලම ලියාපදිංචි නොවේ. එබැවින් පුරප්පාඩු ඇති වන අතර විශ්වවිද්‍යාලය අධ්‍යයන කටයුතු සඳහා සිසුන් බඳවා ගත හැකි උපරිම කාල සීමාව ඉක්මවා යනතුරුත් පුරප්පාඩු පිරවීමට සිසුන් තෝරා එවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නොහැකි වීම හේතුවෙන් විද්‍යා පීඨයේ පාඨමාලා වල පුරප්පාඩු පවතී.<br>එබැවින් විශ්වවිද්‍යාලයට පාලනය කළ නොහැකි පරිබාහිර හේතුවක් නිසා මෙම ඌනතාව සිදුවන බව විගණන වාර්තාවේ සඳහන් කරන ලෙස ඉල්ලමි. |
| | (ඇ) 2014, 2015 හා 2016 වර්ෂ සඳහා කලා පීඨයට බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව 550 දෙනෙකු ලෙස දක්වා තිබුණ ද එම වර්ෂ තුනෙහිදීම පිළිවෙලින් 596 දෙනෙකු,739 දෙනෙකු හා 692 දෙනෙකු බඳවාගෙන තිබීමෙන් වර්ෂ 03 සඳහා බඳවාගත් අතිරික්ත ශිෂ්‍ය සංඛ්‍යාවේ එකතුව 377 දෙනෙකු විය. විශ්වවිද්‍යාලයට බඳවා ගැනීමට හැකි ශිෂ්‍ය සංඛ්‍යාව වසර ගණනාවකට පෙර තීරණය කර තිබූ අතර එම ශිෂ්‍ය සංඛ්‍යාව කාලීනව සංශෝධනය කිරීමට කළමනාකාරීත්වය අවධානය යොමු කර නොතිබීම මේ සඳහා ප්‍රධාන | ශාස්ත්‍ර පීඨයට 2014 වර්ෂයේ සිසුන් 672 ක් ද, 2015 වර්ෂයේ සිසුන් 739 ක් ද, 2016 වර්ෂයෙ සිසුන් 596 ක් ද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරා එවා තිබුණි.<br>ඒ අනුව එවන ලද සියළුම සිසුන් ශාස්ත්‍ර පීඨය විසින් ලියාපදිංචි කරන ලදි. |

| | | |
|---|---|---|
| | වශයෙන් හේතු වී තිබුණි. | |
| **4.2** | **කළමනාකරණ ක්‍රියාකාරකම්** | |
| | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |
| | (අ) 2015 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භෞතික පොත් පරීක්ෂාව අනුව රු.3,292,524 ක් වටිනා පොත් 27,367ක් අස්ථාන ගත වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පොත් 3,298 ක වටිනාකම වූ රු.499,628 ක් ගිණුම් වලින් ලියාහැරීම හැර ඒ සම්බන්ධයෙන් වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අස්ථානගත වූ පොත් වලින් රු.499,628.12 වටිනාකමකින් යුතු පොත් 3298 ක් ලියා හැරීමට කටයුතු කළ අතර 2018, 2019, 2020 හා 2021 වර්ෂ වලදී රු.500,000/= සීමාවට යටත්ව ලියා හැරීමට කටයුතු කරනු ලැබේ. |
| | (ආ) විශ්වවිද්‍යාලය වෙත ලබා දුන් රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන වලින් රු.140,910,000 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි වී තිබුණු අතර ඒ තුළ ඇතුළත් රු.107,590,000 ක් ඉකුත් වර්ෂ ගණනාවක සිට අදාළ අරමුණු සඳහා වැය කිරීමකින් තොරව ඉතිරි කර තිබුණි. | ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ලද මුදල් අදාළ කාර්යයන් සඳහා ගෙවීමට විශ්වවිද්‍යාලය විසින් බැඳී ඇත. තවද ඒ ඒ කාර්යයන් වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ඒ සඳහාම වැය කළ යුතු අතර ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂිත වියදම් පියවීමට යොදා ගත යුතුය. |
| **4.3** | **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | |
| | නිසි ලෙස පූරෝකථනය කළ වැය ඇස්තමේන්තුවකින් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.297,750 ක වියදම් සඳහා අවස්ථා 41 කදී රු.761,350 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | නිසි ඇස්තමේන්තුවක් සහිතව අත්තිකාරම් අයදුම් කිරීමට උපදෙස් දී ඇත. |
| **4.4** | **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්** | |
| | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |
| | (අ) ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන විශ්වවිද්‍යාලය සතුව 2016 දෙසැම්බර් 31 දිනට පැවැති අරමුදල් ගිණුම් 29 කට අදාළ එකතුව රු.23,863,768 | 2017 වර්ෂයේදී භාවිතා කරනු ලැබේ. |

<table>
<tr><td></td><td>ක් අදාළ කායර්යන් සඳහා උපයෝජනය කර නොතිබුණි.</td><td></td></tr>
<tr><td></td><td>(ආ) සමාලෝචිත වෂර්යට අදාළ තොග සමීක්ෂණ වාතර්ාව අනුව ගබඩාව තුළ චලනය නොවන තොග හා සෙමින් චලනය වන තොග පිළිවෙලින් රු.165,518 ක් හා රු.259,760 ක් විය.</td><td>

| චලනය නොවන තොග | |
|---|---|
| මධ්‍යම ගබඩාව Stationary Items | 226,908.34 |
| නඩත්තු ගබඩාව සහ මධ්‍යම ගබඩාව Maintence Item | 5,443.41 |
| | 232,351.75 |
| සෙමින් චලනය වන තොග | |
| මධ්‍යම ගබඩාව Stationary Items | 259,759.90 |

මධ්‍යම ගබඩාවෙන් චලනය නොවන තොග වටිනාකමින් රු. 66,834.00 වන පහත සඳහන් අයිතම 2017 වෂර්යේදී නිකුත් කර ඇත.

| No | අයිතම අංක / විස්තර | ගණන | වටිනාකම |
|---|---|---|---|
| 01 | SPPR-PO2004 | 208 | 55,744.00 |
| 02 | SSND-TO1001 | 11 | 1,430.00 |
| 03 | STNR-TO1003 | 2 | 9,660.00 |
| | | | 66,834.00 |

සෙමින් චලනය වන අයිතමයන්ගේ රු.223,620/= වටිනා තොග විනාශ කිරීම සඳහා කටයුතු කළ අතර අනෙකුත් අයිතමයන් ඉදිරියේදී භාවිතයට ගනු ඇත.

උදා :- 1. පැමිණීමේ ලේඛන
</td></tr>
</table>

| | | |
|---|---|---|
| | | 2. චෙක්/ මුදල් ඇණවුම් ලේඛන<br><br>මේ අනුව මධ්‍යම ගබඩාවෙහි සෙමින් චලනය වන තොග අපහරණය කිරීම සඳහා ක්‍රියා කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා 381 වන මුදල් කමිටුව නිදේශ කර ඇත. |
| | (ඇ) පුස්තකාලයෙන් පොත් වංචනික අයුරින් බැහැර ගෙන යාම වැළැක්වීම සඳහා පුස්තකාල දොරටුව අසල සවිකර තිබෙන ආරක්ෂිත විද්‍යුත් ගේට්ටුව 2016 පෙබරවාරි 08 දින සිට විගණිත දිනය වූ 2017 මැයි 09 දින දක්වා වෂර්යකට අධික කාලයක් අක්‍රිය වී තිබුණද එය අළුත්වැඩියා කර නොතිබුණි. | පුස්තකාලයේ ආරක්ෂිත විදුලි ගේට්ටුව මේ වන විට අළුත්වැඩියා කර ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |
| **4.5** | **ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය** | |
| | පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | |
| | (අ) විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වා ගෙන යනු ලබන පොත්හල, බදු දීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව බදුකරුවෙකු තෝරාගෙන තිබුණි. පොත්හල පවත්වා ගෙන යන වගර් අඩි 685 ක ගොඩනැගිල්ලෙහි තක්සේරු කුලිය නොසලකා 2008 සැප්තැම්බර් සිට 2016 දෙසැම්බර් දක්වා කාලය තුළ එකම ආයතනයක් වෙත බදු දී තිබීම නිසා රු.966,668 ක ආදායමක් අහිමි වී තිබුණි. තවද එම පරිශ්‍රය තුළ පිහිටි බැංකුවක් සහ කිරිහල් දෙකක් වෙනුවෙන් කිසිදු බදු මුදලක් අයකර නොතිබුණි. | 2017.11.13 දින පවත්වන ලද දෙපාතර්මේන්තු ප්‍රසම්පාදන කමිටු රැස්වීමේදී අනුමත කළ පරිදි ඉහත කිරිහල් දෙක සඳහා මාසික කුලී මුදල වශයෙන් රු.1,000.00 බැගින් ද මාසික විදුලි ගාස්තු මුදල වන රු. 5,000.00 බැගින් 2016.09.01 දින සිට මිල්කෝ ආයතනය වෙතින් අයකර ගැනීමට, ශිෂ්‍ය හා සේවක කටයුතු අංශය විසින් කටයුතු කරගෙන යනු ලැබේ.<br><br>අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ යුනිලංකා සිකියුරිටි සවරීස් පුද්ගලික සමාගම ඉදිරිපත් කර තිබූ ලංසු |

| | | |
|---|---|---|
| | (ආ) 2016 මාර්තු 15 දින සිට 2018 මාර්තු 14 දින දක්වා කාලය වෙනුවෙන් විශ්වවිද්‍යාල වල ආරක්ෂක සේවාව සැපයීම සඳහා ලංසු කැඳවීම වෙනුවෙන් පිළියෙල කර තිබුණු පිරිවිතරයන්හි විශ්වවිද්‍යාල වල ආරක්ෂාව සැපයීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක පළපුරුද්ද සපුරා තිබිය යුතු බවට ඇතුළත් කර තිබුණු කොන්දේසිය හේතුවෙන් ඉදිරිපත්ව තිබුණු ලංසු අතරින් ලංසු 03 ක් ප්‍රතික්ෂේප වී තිබුණි.ඒ තුළ ඇතුළත් දෙවන අවම මිළ ගණන වූ රු.41,288,400 ක මිළ ගණන් ඉදිරිපත් කර තිබුණු ලංසුව ප්‍රතික්ෂේප වී තිබීම හේතුවෙන් පස්වන අවම මිළ ගණන වූ රු.44,454,896 කට ලංසුව ඉදිරිපත් කර තිබුණු ආයතනයට ප්‍රසම්පාදනය පිරිනැමීමට සිදු වී තිබුණි. ඒ අනුව එක් වර්ෂයක් සඳහා රු.3,666,496 ක් බැගින් 2016 මාර්තු සිට 2018 මාර්තු මාසය දක්වා රු.7,332,992 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.<br><br>(ඇ) විශ්වවිද්‍යාලයේ මහල් 05 කින් යුත් සුජාතා ජයවර්ධන කාන්තා නේවාසිකාගාරයේ වැසිකිළි 50 ක් හා නාන කාමර 30 ක් නවීකරණය කිරීම සඳහා රු.25,359,367 ක (වැට් සහිත) මුදලකට පුද්ගලික සමාගමක් සමඟ 2013 දෙසැම්බර් 24 දින ගිවිසුමට එළඹ තිබුණි. වැඩ ප්‍රමාද කිරීමේ හේතුවෙන් 2015 ජුනි 16 දින විශ්වවිද්‍යාලය විසින් අදාළ කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කළ බව කොන්ත්‍රාත්කරු වෙත දන්වා තිබුණි .එසේ වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය පරිදි ලබා ගෙන ඇති රු.1,132,114 ක් | ලියවිලි සාරාණුකූල ලංසුවක් ලෙස ඉදිරිපත් කර නොතිබුනු බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. සාරාණුකූලව ඉදිරිපත් නොකරන ලද ලංසු ඇගයීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 යොමුව අනුව ඇගයිය නොහැකි බැවින් එම ලංසුව ප්‍රතික්ෂේප වූ බැවින් අවම මිළගණන් ඉදිරිපත් කර තිබූ ලංසුව හා සංසන්දනය කර වර්ෂ දෙකක කාලයක් සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමුණි.<br><br>කෙසේ වුවද තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව අසම්පූර්ණ බැවින් අවම මිළ ගණන් ප්‍රතික්ෂේප වීමට වූ හේතු නිවැරදිව සටහන් වී නොතිබුණු බව පිළිගනිමි. එසේම තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව නිවැරදි ලෙස සැකසුවේ නම් මෙය සාරාණුකූල ලංසුව බව පැහැදිලි වේ. එබැවින් මෙම කොන්ත්‍රාත්තුව දෙවන අවම මිළ ගණන් ඉදිරිපත් කළ ලංසුකරු වෙත පිරිනැමීමෙන් රු. 7,332,992.00 පාඩුවක් සිදුවී ඇතැයි යන්න විගණන ඡේදයෙන් ඉවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.<br><br>මේ වන විට ආරක්ෂක සේවාව අළුත් කිරීම සඳහා ටෙන්ඩර් කැඳවා ඇත.<br><br>(ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය)<br><br>කොළඹ විශ්වවිද්‍යාලයට අයත් බුලසර් මාවතේ පිහිටා ඇති සුජාතා ජයවර්ධන නේවාසිකාගාරයේ මහල් 05 කින් යුත් වැසිකිලි 50 ක් සහ නාන කාරමර 50 කින් යුත් වැසිකිලි සංකීර්ණයේ අළුත්වැඩියා කිරීමේ කටයුතු සඳහා 2013.12.24 වන දින ගිවිසුමට එළඹි යුනික් ඉංජිනියරින් සමාගමේ කාර්යය අවසන් කිරීමට දැක්වූ ප්‍රමාදය හේතු කොට ගෙන කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කිරීමට ගත් තීරණයෙන් පසු ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.4.8 වගන්තිය පරිදි කාර්ය සාධන ඇපකරය අයකර ගැනීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි යනුවෙන් සඳහන් කිරීම අසත්‍යයකි.<br><br>කොන්ත්‍රාත්කරු වන යුනික් ඉංජිනියරින් සමාගම විසින් සෙලින්කෝ පී.එල්.සී සමාගමෙන් ලබා දී තිබූ වටිනාකම රු.1,132,114.63 ක් වූ C02313CB0018744 අංක දරණ කාර්යය සාධන ඇපකරය ලබාගැනීම සඳහා සෙලින්කෝ ඉන්ෂුවරන්ස් සමාගම වෙත ලිඛිත කටයුතු කර තිබූ අතර කොන්ත්‍රාත්කරු වන යුනික් ඉංජිනියරින් සමාගම කොළඹ දිසා අධිකරණයේ එයට එදිරිව පවරා තිබූ නඩුව හේතුවෙන් සෙලින්කෝ ජී.එල්.සී සමාගම විසින් කාර්යය සාධන ඇපකරය ගෙවීම නතර කරන ලදී.<br><br>මේ වන විට කොළඹ දිසා අධිකරණය විසින් යුනික් ඉංජිනියරින් සමාගම විසින් පවරා තිබූ නඩුව නඩු ගාස්තුවට යටත් කොට නිෂ්ප්‍රභා කර තිබූ අතර උසාවි නියෝගය අප වෙත ලද වහාම අදාල කාර්යය සාධන |

| | | | |
|---|---|---|---|
| | | වටිනා කායර්සාධන ඇපකරය කල් ඉකුත්වීමට පෙර විශ්වවිද්‍යාලය වෙත අයකර ගත යුතුව තිබුණද එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>ඉහත කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කිරීමෙන් අනතුරුව රු.11,197,072 ක්වූ ඉතිරි වැඩ නිමකර ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම වෙනුවට 2015 වෂර්යේ ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් 5 දෙනෙකු වෙත මහල් 5හි ඉතිරි ඉදිකිරීම් වැඩ වෙනම පවරා තිබුණි. | ඇපකරය සෙලින්කෝ ඉන්ෂුවරන්ස් සමාගමෙන් අය කරගැනීම පිණිස එම සමාගම වෙත ලිඛිතව දන්වා ඇත.<br>මේ වන විට අදාළ කායර්ය සාධන ඇපකරයේ වටිනාකම විශ්වවිද්‍යාලයට ගෙවා ඇත. |
| | | (ඇ) සුජාතා ජයවධර්න නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිල්ල, හැව්ලොක් නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිලි, බ්ලොම්ෆෝන්ටේන් නේවාසිකාගාරයේ ඉදිරිපස ගොඩනැගිල්ලේ පහළ මාලය සහ පිටුපස මැද ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම කෙරෙහි කළමණාකරනයේ අවධානය නිසි පරිදි යොමු වී නොතිබූ බැවින් මෙම නේවාසිකාගාර භාවිතයට නුසුදුසු තත්ත්වයේ පැවතියද එහි සිසුන් නේවාසිකව සිටින බව නිරීක්ෂණය විය. | i). වැසි ජලය කාන්දු වීම දීසර් කාලයක් සූයර්ාලෝකයට නිරාවරණය වීම හේතුවෙන් සිදුවී ඇත. වරින් වර සිමෙන්ති කපරාදුව සිදු කළ ද එය ස්ථිර පිළිසකර කිරීමක් නොවන බැවින් ඉහළ කොන්ක්‍රීට් ස්ලැබ් (Concrete slab) එක සහ එහි මතු පිට ඉදි කර ඇති බැම් ජල නිරෝධනය කොට ඒ මතු පිට ආරක්ෂක බදාම යොදා පිළිසකර කර ඇත.<br>පැරණි ගොඩනැගිල්ලේ සියළු අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇති අතර ගොඩනැගිල්ලේ තත්ත්වය පිළිබඳ ගොඩනැගිලි පයෙර්ෂණ ආයතනයෙන් ලබා ගත් වාතර්ාව අනුව රසායනික ආලේපනයකින් කම්බි ආවරණය කොට බදාම යොදා සම්පූණර්යෙන් නවීකරණයට පත් කොට ඇත. අද දිනට අළුත්වැඩියා කටයුතු අවසන් කර ඇති බැවින් මෙම විගණන ඡේදය ඉවත් කරන මෙන් ඉල්ලමි.<br>**(ii )** හැව්ලොක් නේවාසිකාගාරය<br>• ගොඩනැගිලි 02 ක් පියවරයන් දෙකකින් ඉදිකර තාක්ෂණික හේතුවක් නිසා ගොඩනැගිලි දෙක එකක් ලෙස පූට්ටු නොකිරීමෙන් මෙම තත්ත්වය ඇති වී ඇත.මේ සඳහා ජල නිරෝධනය කර සම්පූණර්යෙන් අළුත්වැඩියා කටයුතු කර ඇත.<br>• වහලයේ අළුත්වැඩියා කටයුතු ආරම්භ කර ඇත.<br>• කාණුවෙහි පිළිසකර කටයුතු අවසන් කර ඇත.<br>• සනීපාරක්ෂක කටයුතු කරන සේවකයින්ගේ නුපුහුණු හා නොසැලකිල්ල මත මෙය සිදුවේ. එහෙත් නොකඩවා මෙහි අළුත්වැඩියා කටයුතු කර ඇත. |

<table>
<tr><td></td><td></td><td>(III) නේවාසිකාගාර අලුත්වැඩියා කටයුතු බොහෝ දුරට අවසන් කර ඇති බව උපකුලපතිගේ නිරීක්ෂණ, ලෙස ඡේදයට එක් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.</td></tr>
<tr><td>4.6</td><td>කාර්ය මණ්ඩල පරිපාලනය</td><td></td></tr>
<tr><td></td><td>පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.</td><td></td></tr>
<tr><td></td><td>(අ) සමාලෝචිත වෂර්යේ දෙසැම්බර් 31 දිනට අනුමත කායර් මණ්ඩලයේ පුරප්පාඩු 325 ක් පැවැතුණි.ආචායර්වරුන් පුරප්පාඩු 111 ක් පැවතීම හේතුවෙන් බාහිර කථිකාචායර්වරුන් බඳවාගෙන තිබු අතර සමාලෝචිත වෂර්යේදී බාහිර කථිකාචායර්වරුන් 379 දෙනෙකුගේ සේවය ලබාගැනීම වෙනුවෙන් රු.29,406,870 ක මුදලක් ගෙවා තිබුණි.</td><td><u>2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කායර් මණ්ඩලය</u>
<table>
<tr><th></th><th>තනතුර</th><th>අනුමත</th></tr>
<tr><td>මහාචායර්</td><td>ජ්‍යෙෂ්ඨ මහාචායර්</td><td>20</td></tr>
<tr><td></td><td>මහාචායර්</td><td>91</td></tr>
<tr><td></td><td>සහාය මහාචායර්</td><td>29</td></tr>
<tr><td>කථිකාචායර්වරු</td><td>ජ්‍යෙෂ්ඨ කථිකාචායර්(I/II)</td><td>282</td></tr>
<tr><td></td><td>කථිකාචායර්වරු</td><td>216</td></tr>
<tr><td>පුස්තකාල සේවා</td><td>පුස්තකාලයාධිපති</td><td>01</td></tr>
<tr><td></td><td>නියෝජ්‍ය පුස්තකාලයාධිපති</td><td>02</td></tr>
<tr><td></td><td>ජ්‍යෙෂ්ඨ සහාකාර පුස්තකාලයාධිපති (I/II)</td><td>09</td></tr>
<tr><td></td><td>සහකාර පුස්තකාලයාධිපති</td><td>06</td></tr>
<tr><td></td><td>ජ්‍යෙෂ්ඨ පයෙර්ෂණ නිළධාරී</td><td>01</td></tr>
<tr><td></td><td>පයෙර්ෂණ නිළධාරී</td><td>04</td></tr>
<tr><td></td><td>සංඛ්‍යාන නිළධාරි (statistician)</td><td>01</td></tr>
<tr><td>මුළු එකතුව</td><td></td><td>662</td></tr>
</table></td></tr>
</table>

| | | |
|---|---|---|
| | (ආ) කාලීනව වැදගත් නොවන යතුරු ලේඛක තනතුරු 05 ක් සහ ලඝු ලේඛක තනතුරු 17 ක් පුරප්පාඩු පැවති අතර එම තනතුරු වෙනුවට කාලීනව වැදගත් වන තනතුරු ඇතිකර ගැනීම කෙරෙහි අවධානය යොමු කර තිබුණි. | මෙම විශ්වවිද්‍යාලයේ 2016.12.31 දිනට අධ්‍යයන කායර් මණ්ඩලයේ පුරප්පාඩු 111 ක් තිබුණි. 2017 වෂර්ය තුලදී මින් 41 ක් බඳවා ගන්නා ලදී. එසේම 2017 වෂර්ය තුළදී ආචායර්වරුන් 20 ක් විශ්‍රාම ගෙන හා ඉල්ලා අස්වී ඇත. ඒ අනුව දැනට පුරප්පාඩු පවතින්නේ 90 ක ප්‍රමාණයකි. මෙයට අමතරව 2017 වෂර්ය තුලදී අළුතින් අධ්‍යන කායර් මණ්ඩල තනතුරු 111 ක් මහභාණ්ඩාගාරය විසින් අනුමත කර ඇත. නව පීඨයක් වන තාක්ෂණික හා භෙද පීඨයටද මෙම නව තනතුරු අදාළ වන අතර එම පුරපුපාඩු පිරවීම සඳහා මෙ වනවිටත් පුවත්පත් දැන්වීම් පලකර ඇත.<br><br>යතුරු ලේඛක හා ලඝුලේඛක තනතුර කාලීනව වැදගත් වන තනතුරු බවට පරිවතර්නය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සදු කරමින් පැවති අතර මේ වන විට නිකුත් කර ඇති 2017 නව තනතුරු ප්‍රතිපාදන වාතර්ාවෙහි අවශ්‍ය සංශෝධනයන් සිදු කර ඇත. |
| **5.** | **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය** | |
| **5.2** | **අයවැය ලේඛනමය පාලනය** | |
| | සමාලෝචිත වෂර්යේ අයවැය ලේඛනයේ වැය විෂයයන් 20ක අයවැය ගත වියදම් හා තථ්‍ය වියදම් අතර 10% සිට 100% දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | (එක් වැය විෂයක් සඳහා 100% විචලන ප්‍රතිශතයක් දැක්වුවත් සමස්ථ විචලනය 4.26% කි.) |
| **6.** | **පද්ධති හා පාලනයන්** | |
| | විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. | |

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ | |
|---|---|---|---|
| | (අ) ස්ථාවර වත්කම කළමණාකරනය | දේපළ | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත. |

| | | | |
|---|---|---|---|
| | | අයිතිය තහවුරු කර නොගැනීම, වත්කම් නඩත්තු කිරීම හා අපහරණය පිළිබඳ දුවර්ලතා පැවතීම. | |
| | (ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය පියවර නොගැනීම. | සොයා බලා ශේෂ නිරවුල් කිරීමට පියවර ගනු ඇත. |
| | (ඇ) අරමුදල් පවත්වාගෙන යාම | අරමුදල් පිහිට වූ නිශ්චිත කාර්යයන් සඳහා නොයෙදවීම | අරමුදල නිශ්චිත පරිදි උපයෝජනය කිරීම සඳහා පියවර ගෙන ඇත. |
| | (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | අදාළ ලිපිගොනු විධිමත්ව නඩත්තු නොකිරීම සහ අධීක්ෂණය දුවර්ල මට්ටමක පැවතීම | කොන්ත්‍රාත් කටයුතු වල අධීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | (ඉ) කායර් මණ්ඩල පරිපාලනය | අධ්‍යයන කායර් මණ්ඩලය පැමිණීම සටහන් නොකිරීම. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගත යුතු නිරීක්ෂණයකි. |
| | (ඊ) පුස්තකාල පරිපාලනය | විධිමත් පරිදි පුස්තකාල පොත් සමීක්ෂණ නොපැවැත්වීම, සංසන්දනාත්මක ලේඛන විධිමත්ව පවත්වාගෙන නොයාම. | පුස්තකාල පොත් සම්බන්ධව සමීක්ෂණයක් පැවැත්වීම ආරම්භ කර ඇත. |



**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක**

**උපකුලපති**

... Meeting of Mgt. Com. held on 19.11.2015

503rd Meeting of Council held on 09.12.2015

9. Request for Vehicle to Travel to Residence at an emergency – Mt. No. 91.08 (j)

Senior Student Counsellor, Dr. M T M Mahees has requested transport facilities to travel to his residence at Kuliyapitiya when he is compelled to stay in the university late night due to some students' activities.

The Council on the recommendation of the Management Committee granted its approval to allow him to use a University vehicle to travel to his residence only at an emergency situation with the prior approval of the Vice-Chancellor/Registrar subject to a maximum of four (04) times per month for this purpose.

University of Colombo
Sri Lanka
17 APR 2018
Academic ... Publication
Branch

ඇමුණුම -01